CRI
中国国际广播电台
CHINA RADIO INTERNATIONAL

සුභාසර
蓮花

中国国际广播电台和斯里兰卡红十字协会联合出版

国际台斯里兰卡广播孔子课堂成立五周年特刊

CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය පිහිටුවීමේ 5 වන සංවත්සරය වෙනුවෙන් නිකුත් කරන විශේෂ කලාපය

විශේෂ කලාපය

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය

SINHALA SERVICE
CHINA RADIO INTERNATIONAL
No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040
Tel: 00 86 10 6889 2330/2374
Fax: 00 86 10 68892361
Email: sinhalaservice@gmail.com
Web: http://sinhalese.cri.cn/
Facebook: Cheena Sinhala handa
Twitter: Voice of China-Lanka
Wechat: srilankacri

2014 ජූලි - විශේෂ කලාපය

අනුශාසකත්වය
වං සියඕ තුං
ජගත් අබේසිංහ
සුදත් මඩුගල්ල

ප්‍රධාන සංස්කාරක
ෂෙං ලී

සංස්කාරක
ෂාඕ ජී යං
බූ යුන්

ප්‍රකාශනය
චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය
සහ
ශ්‍රී ලංකා රතු කුරුස සමාජය

ග්‍රැෆික් නිර්මාණය
සම්පත් සමීර පෙරේරා
රෙඩ්මෝ ප්‍රින්ටින්

මුද්‍රණය
රෙඩ්මෝ ප්‍රින්ටින්
104, රතු කුරුස ගොඩනැගිල්ල,
ධර්මපාල මාවත, කොළඹ 07.

කොන්ෆියුසියස්තුමා

卷首语 ...

从2009年7月28日到2014年7月28日，
国际台斯里兰卡广播孔子课堂走过了五个春秋冬夏；
这里，我们记录下这辉煌的1826个日日夜夜，
而今，我们心怀感激，肩负重任，
继续前行。。。。。。。

පස් වසරක අභිමානය ....

කෘතවේදීත්වය, වගකීමෙන් යුතු සේවය සහ
නොනවතින දිගු ගමනක අභිලාෂය සමඟ
CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ
දින 1826ක හෙවත් වසර 2009 ජූලි 28 සිට
වසර 2014 ජූලි 28 දක්වා
වසර පහක අභිමානවත් මතක සටහන්
මෙවර ඔබ හමුවේ තැබෙයි ...

ශ්‍රී ලංකා චීන තානාපති තුමාගේ සුභපැතුම

中华人民共和国大使馆

贺 词

值此中国国际广播电台斯里兰卡兰比尼广播孔子课堂成立5周年之际，我谨向课堂理事会全体成员、教师、志愿者以及课堂全体学员们表示热烈祝贺！

5年来，在国家汉办的指导下，课堂教师和志愿者们与斯里兰卡合作伙伴和当地对华友好组织密切合作，不辞辛劳，举办了丰富多彩的汉语教学和中国文化推广活动，培养了众多汉语学员。你们用自己辛勤的汗水，浇灌出一片新田地，取得了可喜成绩。

中斯友谊源远流长，两国友好关系未来寄希望于年轻一代。希望课堂全体教师和志愿者们再接再厉，继续与斯里兰卡合作伙伴精诚合作，努力进取，进一步提高办学质量，培养更多年轻人才，为中斯两国人民之间的友谊持久深入发展做出新贡献。

中华人民共和国驻
斯里兰卡民主社会主义共和国
特命全权大使
吴江浩
二〇一四年六月二十七日

中华人民共和国大使馆

ලුම්බිණි විද්‍යාලයීය CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය පිහිටුවීමේ 5වන සංවත්සරය නිමිත්තෙන්, මෙම මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයේ සියළු සාමාජිකයන්ටත් ගුරුවරුන්ට සහ මෙම මධ්‍යස්ථානයේ ශිල්ප හදාරන හා හැදෑරූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මම මුලින්ම උණුසුම් සුභ පැතුම් ප්‍රකාශ කරමි.

ගෙවී ගිය වසර 5 තුළ, හන්බන් ආයතනයේ මාර්ගෝපදේශකත්වය යටතේ, ශ්‍රී ලංකාවේ සහයෝගය ඇතිව, ලුම්බිණි විද්‍යාලයීය CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ ගුරුවරු චීන භාෂාව ප්‍රගුණ කළ ශිෂ්‍යයන් විශාල පිරිසක් බිහි කිරීමට සමත් වූහ. එමෙන්ම, ගුරුවරු චීන භාෂාව ඉගෙනීමේ හා චීන සංස්කෘතිය ප්‍රචලිත කිරීමේ මනා ක්‍රියාකාරකම් රැසක් පැවැත්වූහ. මෙබඳු ජයග්‍රහණ සහ ගුරුවරුන්ගේ දායකත්වය අවියෝජනීය ය.

එදා මෙදා තුර, චීනය සහ ශ්‍රී ලංකාව අතර සුහද මිත්‍රත්වයක් පවතියි. දෙරට මිත්‍ර සබැඳියාවේ අනාගතය තරුණ පරපුර මත රඳා පවතියි. ශ්‍රී ලංකාවේ සහයෝග සහිත ව ලුම්බිණි විද්‍යාලයීය CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානයට වඩාත් වැඩි චීන භාෂා ප්‍රවීණයන් බිහි කිරීමට හැකි වේවායි මම ප්‍රාර්ථනා කරමි. මධ්‍යස්ථානයට දෙරට ජනතාව අතර මිත්‍රත්වය අඛණ්ඩව වර්ධනය කිරීමට දායකත්වය ලබා දිය හැකි වේවායි ද මම හද පතුළින් ම ප්‍රාර්ථනා කරමි.

ශ්‍රී ලංකාවේ චීන තානාපති
වු ජියං හාඕ
2014 ජුනි 27වනදා

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ සුභපැතුම

中国国际广播电台

贺 词

中国与斯里兰卡两国人民间的友谊源远流长，两国人民的友好交往离不开语言和文化。

中国国际广播电台斯里兰卡兰比尼广播孔子课堂成立5年来，举办了丰富多彩的中国文化推广活动，培养了2000多名学员，造就了一批优秀的中国文化推广者和实践者，在汉语教学和中国文化推广领域取得显著成绩，为促进两国人民的文化交流和相互了解做出积极贡献。

课堂依托国际台资源优势在当地建立了良好的社会关系网络，在斯里兰卡享有较高知名度和影响力。

国际台僧伽罗语部制作开发的《导游汉语教程》课件及音频广播节目在教学实践和调频播出中均收到良好效果。

展望未来，中国国际广播电台将协同外方继续办好斯里兰卡兰比尼广播孔子课堂，努力服务于斯里兰卡社会和人民，深化中斯两国人民的友谊。

中国国际广播电台台长
王庚年

2014年6月19日

CRI

චීනය සහ ශ්‍රී ලංකාව අතර මිතුදම බොහෝ ඈත අතීතයේ සිට ම පැවතෙන්නකි. මෙවැනි සබඳියාවක් දෙරට අතර භාෂා සහ සංස්කෘතික හුවමාරු සමග සමීප ව සම්බන්ධ ය.

මේ වසර වන විට, ලුම්බිණි විද්‍යාලයීය CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය ආරම්භ වී වසර 5ක් සපිරෙයි. මෙම කාලය තුළදී, චීන සංස්කෘතිය ප්‍රචලිත කිරීමට අපූරු ක්‍රියාකාරකම් බොහොමයක් සිදු කර තිබේ. විවිධ චීන භාෂා පුහුණු වැඩසටහන් යටතේ, 2000කට වැඩි ශ්‍රී ලාංකික ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිරිසකට පුහුණුව ලැබී ඇත. එමෙන් ම, චීන සංස්කෘතිය ප්‍රචලිත කිරීම කෙරෙහි උනන්දුව දක්වන ශ්‍රී ලාංකික ප්‍රවීණයන් පිරිසක් ද ඉන් බිහි වී තිබේ. චීන භාෂාව සහ චීන සංස්කෘතිය ප්‍රචලිත කිරීම සඳහා CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය වැදගත් මෙහෙවරක් ඉටු කර තිබේ. මීට අමතරව, චීනය සහ ශ්‍රී ලංකාව අතර සංස්කෘතික හුවමාරු හා අන්‍යෝන්‍ය අවබෝධය පුළුල් කිරීමට ද මෙම මධ්‍යස්ථානය ධනාත්මක දායකත්වයක් ලබා දී තිබේ.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සහයෝගයෙන්, මේ වන විට, CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ බොහෝ ක්ෂේත්‍ර සමග යහපත් සබඳතාවක් ඇති කර තිබේ. දැනට මෙම මධ්‍යස්ථානයට ශ්‍රී ලංකාව තුළ ඉහළ කීර්තිනාමයක් හා වැදගත් බලපෑමක් හිමි ව ඇත.

මේ අතර, චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල අංශයේ ප්‍රධානත්වයෙන් සකසා ඇති සංචාරක චීන භාෂා පාඩම් මාලාව සහ ඊට අදාළ ශ්‍රව්‍ය වැඩසටහන් චීන භාෂාව හදාරන ශ්‍රී ලාංකික ශිෂ්‍යයින්ට රුකුල් වී තිබේ.

CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය තවදුරටත් වැඩිදියුණු කිරීමටත්, චීනය සහ ශ්‍රී ලංකාව අතර මිත්‍රත්වය තවදුරටත් පුළුල් කිරීමටත්, ඉදිරියේදී චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ ශ්‍රී ලංකාවේ අදාළ ආයතන අඛණ්ඩ ව සහයෝගයෙන් කටයුතු කරනු ඇතැයි මම අපේක්ෂා කරමි.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ අධ්‍යක්ෂ ජනරාල්
වාං ගෙන් නියැන්
වසර 2014 ජූනි 19 දින

විදේශ කටයුතු අමාත්‍යතුමාගේ සුභපැතුම

Prof. G. L. Peiris

මහාචාර්ය ජී. එල්. පීරිස්

අධ්‍යාපන අමාත්‍යතුමාගේ සුභපැතුම

බන්දුල ගුණවර්ධන (පා.ම.)

Bandula Gunawardhana (M.P.)

අධ්‍යාපන අමාත්‍ය

Minister of Education

ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත

A. D. Susil Premajayantha

2014.05.09

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය
இளைஞர் அலுவல்கள் மற்றும் திறன்கள் அபிவிருத்தி அமைச்சு
MINISTRY OF YOUTH AFFAIRS & SKILLS DEVELOPMENT

<u>යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන</u>
<u>ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය</u>

ශ්‍රී ලංකාව හා චීනය අතර දිගු කාලීන ද්විපාර්ශ්වික සම්බන්ධතා තවත් දිගු කලක් වඩාත් ශක්තිමත්ව පවතින්නට මූලාරම්භය සැකසෙන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමන්ගේ පාලනයත් සමගිනි. ඒ, ඊට අවැසි චීන භාෂාව හා සංස්කෘතිය වඩාත් ප්‍රතිඵලදායී ලෙසින් ශ්‍රී ලංකිකයින් අතර ප්‍රචලිත වීමත් සමගය.

විදේශීය රටවලට සිය භාෂාව ඉගැන්වීමේ පූර්ණ වගකීම් සහිත චීනයේ "හන්බන්" ආයතනය එහි කොන්ෆියුසියස් මූලස්ථානය හරහා මීට පස් වසරකට පෙර ලුම්බිණි විද්‍යාලයේ දී චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ මෙරට කොන්ෆියුසියස් මධ්‍යස්ථානය අරඹන්නේ පෙර කී එම උවමනාව නිසාමය. එදා අරමුණ මෙදා චීන ශ්‍රී ලංකා ප්‍රබල සබඳතා කෙරෙහි සෘජුවම බලපා තිබීම බලවත් සතුටට කරුණකි.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවයේ "සුභාසර" විශේෂ කලාපය මෙවර ලුම්බිණි විද්‍යාලයේ උදාර මෙහෙවරට ප්‍රණාමය පුදන්නට සැරසී සිටී. ජාතික වගකීමට උරදෙන ශ්‍රී ලංකා - චීන විදේශ සබැඳියාවට භාෂාමය වශයෙන් අමිල මෙහෙවර ඉටුකරන ලුම්බිණි විද්‍යාලයේ කොන්ෆියුසියස් මධ්‍යස්ථානයට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතු බව දයාර්ද්‍රයෙන් යුතුව සටහන් කරමි.

ඩලස් අලහප්පෙරුම (පා.ම)
යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍ය

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍ය තුමාගේ සුභපැතුම

ඩිලාන් පෙරේරා (පා.ම)
විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍ය

සුබ පැතුම්

[illegible]

[illegible]

[illegible]

[illegible]

ශ්‍රී ලංකා රතු කුරුස සමාජ්ය සභාපතිතුමාගේ සුභපැතුම

ශ්‍රී ලංකා රතු කුරුස සමාජය
இலங்கை செஞ்சிலுவைச் சங்கம்
Sri Lanka Red Cross Society

වර්තමාන ලෝකයේ වේගවත් සංවර්ධන ක්‍රියාවලියට සුවිශේෂී දායකත්වයක් ලබා දීමට චීනය සමත් වී ඇත. ශ්‍රී ලංකාව හා චීනය අතර පවතින දිගුකාලීන මිතුදම සංවර්ධන ක්‍රියාවලියේදී මෙන්ම අධ්‍යාපන, ආගමික හා සංස්කෘතික අංශයන්හීදී ද ප්‍රබල දායකත්වයක් ලබා දී ඇත.

ශ්‍රේෂ්ඨ ඉතිහාසයකට උරුමකම් ඇති චීන රාජ්‍යයෙන් අපට උගත හැකි දෑ බොහෝය. ඒ සදහා චීන CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය වසර 5ක් තුල කරන ලද උදාර සේවය අගය කොට සලකමි.

මෙම සත්කාර්යය තවදුරටත් සාර්ථකව පවත්වාගෙන යාමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

ජගත් අබේසිංහ
සභාපති
ශ්‍රී ලංකා රතු කුරුස සමාජය

Geneva Convention of the 12th August 1949 and the UN resolution 55(1) recognizes the Red Cross National Society as an Auxiliary to the Government in its **Humanitarian Activities** and its right to act upon its **Fundamental Principles** of **Humanity, Impartiality, Neutrality, Independence, Voluntary Service, Unity and Universality.**

National Headquarters, No 104, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.
Tel. (94) 11 2691095, (94) 11 7651400, **Fax.** (94) 11 2695434, (94) 11 4621079, **E-Mail.** president@redcross.lk, directorgeneral@redcross.lk, **Website.** www.redcross.lk

ලුම්බිණි විද්‍යාලයේ විදුහල්පති තුමාගේ සුභපැතුම

ලුම්බිණි විද්‍යාලය

LUMBINI COLLEGE

Lumbini Mawatha,
Havelock Town, Colombo 05.

Principal : Oshara Pandithharathne

CRI ශ්‍රී ලංකා ශ්‍රාවක සංසදයේ සුභපැතුම

CRI listeners

CRI – Sri Lanka Listeners

පස් වසරක පිය සටහන් .....

චීන භාෂාව ඉගැන්වීම පිළිබඳව ලුම්බිණි විද්‍යාලයට ඇත්තේ දිගු ඉතිහාසයකි. අදට වර්ෂ 15කට පමණ පෙරදී චීන භාෂාව ඉගෙනීමේ පිපාසයෙන් පෙලුන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා චීන භාෂාව ඉගැන්වීමේ පන්තියක් හවි වේමින් මහාචාර්ය තුමා විසින් පවත්වන ලද බව අපට අසන්නට ලැබී තිබේ. චීන සමාජ හා සංස්කෘතික සහයෝගීතා සංගමය විසින් සංවිධානය කරන ලද මෙම චීන භාෂා පංතිය ආරම්භක කණ්ඩායමෙන්ම අවසාන වී ඇත.

චීනය සමග සබඳතා පවත්වන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක සංවිධාන සමග අපගේ සබඳතා ආරම්භ වන්නේ 2000 වර්ෂයේදීය. චී චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවයේ ශ්‍රී ලංකා අසන්නන්ගේ සංගමය හා ශ්‍රී ලංකා චීන සමාජ හා සංස්කෘතික සහයෝගීතා සංගමයේ සාමාජිකත්වය ලැබීමත් සමගය.

චීනය පිළිබඳව බොහෝ දේ අප අසා තිබුණ ද ප්‍රථම වරට 2004 වර්ෂයේදී සිදු කළ චීන සංචාරයේ දී ජීවමාන අත්දැකීම් ලබමින් අධ්‍යතන ලෝකය තුළ චීනය සිය පෞරුෂය මොනවට තහවුරු කරගෙන තිබෙන ආකාරය යථාවක් ලෙස දුටුවෙමු. ඒ නිසාම චීනය හා සෙසු ලෝකය සමග සන්සන්දනාත්මකව බැලීමට අපගේ කාලය මිඩංගු කළෙමු.

ගෝලීයකරණය හේතු කොට ලෝකය කුඩා වී ඇත. සන්නිවේදනයේ සීඝ්‍ර දියුණුව සමග සංකෝචනය වූ ලෝකය තුළ අන් කවර කලෙකවත් නොවූ තරමට ජාතීන් අතර සමීපතාව වැඩි වී ඇත. මෙහිදී සන්නිවේදනයේ ප්‍රබල මෙවලම ලෙස භාෂා අධ්‍යාපනයේ වැදගත්කම සියළුම ජාතීන් වටහා ගෙන ඇත.

LUMBINI VIDYALAYA

ඉර නොබසින අධිරාජ්‍ය ලෙස මහා බ්‍රිතාන්‍ය පැවති සමයේ ඉංග්‍රීසි භාෂාව ජාත්‍යන්තර භාෂාවක් ලෙස ව්‍යාප්ත වුවා සේම වර්තමානයේ සුපිරි බලවතුන් අභිබවනය කරමින් නැගී සිටින, චීනයේ භාෂාව ඉගෙනීම සමස්ත ලෝක ජනතාවට අත්‍යවශ්‍ය සාධකයක් බවට පත්ව ඇත.

ලෝක ජනගහණයෙන් 20%ක්ම ව්‍යවහාර කරන චීන භාෂාව හැදෑරීමට බොහෝ රටවල් සංඛ්‍යාවක් පෙළඹී ඇත්තේ ඒ නිසාය.

මෙම යතාර්ථය තුළ අනාගතය ජය ගැනීමට අපේක්ෂිත ශ්‍රී ලාංකික දරුවන්ට චීන භාෂාව ඉගැන්වීම අත්‍යවශ්‍ය වේ.

මෙකී අවශ්‍යතාව සපුරනු වස් 2007 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ චීන භාෂාව ඉගැන්වීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම පිළිබඳව අදාළ පාර්ශව අතර සංවාදයක් ඇති විය. ලුම්බිණි විද්‍යාලයේ පිහිටුවීමට යෝජිත එම ආයතනය වෙනුවෙන් විදුහල්පති වශයෙන් අප ද චීන ජාත්‍යන්තර ගුවන් විදුලියද ශ්‍රී ලංකා චීන සමාජ හා සංස්කෘතික සහයෝගීතා සංගමයද ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි අසන්නන්ගේ සංගමයද නිරන්තර සාකච්ඡා වල නිරත විය.

මෙම සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස ලුම්බිණි විද්‍යාලයීය CRI ශ්‍රාවක කවයට අනුබද්ධව කොන්ෆියුසියස් පංතිකාමරයක් පිහිටුවීමට චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ එකඟතාව පළ විය. චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය දැනුම් දෙන ඕනෑම අවස්ථාවක මෙම ආයතනය පිහිටුවිය හැකි බව අප විසින් ලිඛිතව දැනුම් දෙන ලදී.

我们这五年...

一、国际台斯里兰卡兰比尼广播孔子课堂介绍

国际台斯里兰卡兰比尼广播孔子课堂是经国家汉办、孔子学院总部授权，由中国国际广播电台、国际台斯里兰卡兰比尼听众协会合作建立，是斯里兰卡第一家广播孔子课堂。课堂于2009年7月28日正式揭牌成立。课堂成立五年以来，充分发挥自己中方合作单位的媒体优势，利用国内资源和在当地拥有的良好社会联系网络，发挥自身听众资源，进一步扩大了汉语推广和中国文化在斯里兰卡的宣传和影响力度。目前课堂在斯里兰卡已经建立了相当的影响力和知名度。

中国国际广播电台（CRI）创办于1941年12月3日，是中国向全世界广播的国家广播电台。其宗旨是“向世界介绍中国，向中国介绍世界，向世界报道世界，增进中国人民与世界人民之间的了解和友谊”。目前使用65种语言向全世界传播, 是全球使用语种最多的国际传播机构。2010年，中国国际广播电台开办中国国际广播电视网络台(CIBN)。国际台僧伽罗语广播开播于1975年1月1日。目前僧伽罗语广播为中国唯一使用斯里兰卡官方语言之一的僧伽罗语进行广播的媒体。目前广播节目通过短波、调频以及互联网向斯里兰卡全境播出，僧伽罗语部还出版了本土化僧伽罗语季刊《莲花》。节目受众涵盖了斯里兰卡各个阶层各个年龄段，其中既有学者、教师、学生、农民，也有僧人、公司职员以及政府官

员。此外，僧伽罗语部还承担了由国家汉办授权，中国国际广播电台出版发行的《每日汉语》（僧伽罗语版）的翻译编辑工作。制作的系列节目已在对斯广播中播出。该图书也在课堂教学中广泛使用，受到学员好评。近40年来，僧伽罗语广播不断发展，节目内容日益贴近听众，节目形式愈加活泼生动，在斯里兰卡的影响力日渐强大，已成为斯里兰卡听众了解中国最直接、最有效的途径。此外，僧伽罗语广播部还与斯里兰卡各主流媒体建立了广泛的合作。

斯里兰卡兰比尼中学位于斯里兰卡首都科伦坡，是当地一所具有85年历史的著名中学。现有近3000名学生在校学习。兰比尼听众协会是依托兰比尼中学成立的国际台听众俱乐部，是国际台斯里兰卡全国听众协会的下属分会。兰比尼听众协会除积极组织成员收听国际台僧伽罗语广播外，还积极、踊跃参与国际台在斯里兰卡各地举办的各类推介中国文化的活动，组织成员参加国际台举办的各类知识竞赛。

国际台斯里兰卡兰比尼广播孔子课堂由课堂理事会负责管理，制定有关广播孔子课堂运转和发展的重大政策，承担广播孔子课堂正常运转的全部责任。理事会下设具体执行机构，具体执行机构工作人员由兰比尼听众协会工作人员组成。课堂理事会现有成员8名，课堂现有教师8人，其中本土教师2人，国内公派教师及志愿者6人。

课堂与目前由国内大学和国外大学合作成立的孔子学院不同，广播孔子课堂不仅限于大学之内，而是面向斯里兰卡社会各个阶层。汉语学习手段多样化，借助国际台独有的全媒体和所在国母语传播的优势，使用学习者的母语，通过无线广播、在线广播和课堂面授、多媒体教学等多种形式教授汉语知识，并利用自身媒体优势和与所在国媒体之间的广泛合作及庞大的听众群体，举办各种中国文化传播活动，形势灵活多样。

මේ අනුව චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සමග ලුම්බිණි කොන්ෆියුසියස් පංති කාමරය පිහිටුවීමේ අවබෝධතා ගිවිසුමක් 2008 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ 08වන දින අත්සන් කරන ලදී. එම වර්ෂයේදීම දෙසැම්බර් මාසයේ දී බෙයිජිං නගරයේ පවත්වන ලද තුන්වන කොන්ෆයුසියස් සමුළුවට සහභාගී වීමේ අවස්ථාව අප වෙත ලැබුණි. ලෝකයේ සෙසු රටවල නියෝජිතයන්ගේද සහභාගීත්වයෙන් පවත්වන ලද මෙම සමුළුවට සහභාගී වීම හේතු කොට ඉදිරියේදී ආරම්භ කිරීමට යෝජිත ලුම්බිණි කොන්ෆියුසියස් පංති කාමරයේ කටයුතු සංවිධානය කිරීමට පුළුල් අවබෝධයක් ලැබුණි.

2009 වර්ෂයේ පෙබරවාරි මාසයේ දී මධ්‍යස්ථානය ඉදි කිරීමේ කටයුතු ආරම්භ විය. බිම් මහල පමණක් සම්පූර්ණව පැවති CRI ගොඩනැගිල්ලේ පළමු මහළ මේ සඳහා යොදා ගැනීමට තීරණය විය. ඉතා ඉක්මනින් ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් තට්ටුව පමණක් දමා තිබූ පළමු මහලේ සියළු වැඩ කඩිනමින් නිම කරන ලදී. විදුලි අවශ්‍යතා සපුරා වායු සමීකරණය කොට ලී බඩු උපකරණ සපයා එකවර සිසුන් 28 දෙනෙකුට ඉගෙනීමට හැකි ලෙස පරිගණක පහසුකම් සහිත පංති කාමරය නිම කරනු ලැබීය. රුපියල් මිලියන 10කට වඩා වැඩි වූ මෙම මූලික පිරිවැය හන්බන් ආයතනය විසින් දරනු ලැබීය.

මෙම මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ අනුමැතිය ලැබුණු අතර ලුම්බිණි විද්‍යාලය පළාත් සභා පාලනයෙන් ඉවත්ව ජාතික පාසලක් බවට පත්වූ පසුව අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් තුමා විසින් ඊට අවශ්‍ය නිසි අනුමැතිය ලබා දෙන ලදී.

මධ්‍යස්ථානයේ වැඩ ආරම්භ කිරීමට චීන භාෂා ගුරුවරුන් නොමැතිකමේ අඩුව දේශීය ගුරු භවතුන් වෙතින් සපුරා ගතිමු. ඒ අනුව අපගේ ආරම්භක චීන භාෂා ගුරුතුමිය වූයේ එම විෂය පිළිබඳ පශ්චාත් උපාධිධාරී නදීකා අත්තනායක මහත්මියයි. ඉන් අනතුරුව හන්බන් ආයතනය විසින් අවශ්‍ය චීන ජාතික ගුරු භවතුන් ලබා දෙන අතර CRI අධ්‍යක්ෂ වරයෙක්ද පත්කර එවනු ලැබීය. එය මේ දක්වා අඛණ්ඩව සිදුවේ.

ලුම්බිණි CRI කොන්ෆියුසියස් ආයතනයේ අභිමානවත් ගමන ආරම්භ වන්නේ එය නිළ වශයෙන් විවෘත කිරීමත් සමඟය.

2009 ජූලි මස 28 වන දින එවකට ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යවරයාව සිටි සුසිල් ප්‍රේමජයන්ත මහතාගේ ප්‍රධානත්වයෙන් ඉංජිනේරු සේවා අමාත්‍ය රාජිත සේනාරත්න මහතා, කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය අතාවුද සෙනෙවිරත්න මහතා, බස්නාහිර පළාත් ආණ්ඩුකාර අලවි මවුලානා මහතා, චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ උසස් නිළධාරීන්ද ඇතුළුව උත්සව ශ්‍රීයෙන් කොන්ෆියුසියස් මධ්‍යස්ථානය විවෘත කරන ලදී.



එතැන් සිට 2014 ජූලි මස 28වන දිනට පස්වන විය සපුරන කොන්ෆියුසියස් මධ්‍යස්ථානය ගතවූ පස් වසර තුළ ඉටු කරන ලද සේවය අභිමානයෙන් සිහිපත් කළ හැකිය.

二、历年大事记

2009年

1、课堂成立

国际台斯里兰卡兰比尼广播孔子课堂揭牌仪式于2009年7月28日在位于首都科伦坡的兰比尼学校举行。斯里兰卡教育部部长、建设与工程服务部部长等斯里兰卡官员、中国驻斯里兰卡大使馆文化处官员、中斯各界友好人士、孔子课堂师生代表、国际台访斯代表团等600多人参加了揭牌仪式。

斯里兰卡总统马欣达·拉贾帕克萨、时任斯里兰卡总理拉特纳西里·维克拉马纳亚克、斯里兰卡驻华大使、时任中国人民对外友好协会会长陈昊苏、中国国际广播电台台长王庚年为课堂揭牌发来了贺信或贺电。时任斯里兰卡总理拉特那西里·维克拉马纳亚克在贺信中说，国际台斯里兰卡兰比尼广播孔子课堂的正式揭牌是斯中两国文化交流的一大盛事。

时任斯里兰卡教育部部长苏西尔·普雷姆贾杨德和国际台僧伽罗语部主任王晓东共同为课堂揭牌。普雷姆贾杨德部长说，广播孔子课堂的建立为斯民众学习汉语、了解中国文化搭建了一个难得的平台。

中国广播孔子学院于2007年12月6日在北京正式成立。经孔子学院总部授权，截至目前，国际台已在海外建立了13家广播孔子课堂。

2、庆祝新中国诞辰60 周年暨“美丽中国”图片展

2009年9月30日，由孔子课堂、国际台斯里兰卡听众协会联合举办的庆祝中华人民共和国成立60周年图片展在斯里兰卡人民图书馆举行。斯里兰卡西方省省督、中国驻斯里兰卡大使馆文化处官员、兰比尼广播孔子课堂负责人及国际台斯里兰卡听众协会主席等出席了图片展开幕式并致辞。

国际台斯里兰卡听众协会成员，兰比尼中学师生，中斯友好人士八百余人参观了该图片展。该展览还在斯里兰卡各地进行了为期两个月的巡展，展览展出的50余幅图片集中反映了60年来中国发生的巨大变化及当代中国的真实面貌。斯里兰卡主流媒体对展览的开幕式进行了报道。

2009年10月19日，为庆祝新中国诞辰六十周年，由斯里兰卡兰比尼广播孔子课堂和斯里兰卡听众协会联合举办的“美丽中国”大型图片巡展第二站在康提的达尔马拉贾中学隆重举行。

达尔马拉贾中学校长S. M. 吉尔提纳特那、时任全斯听协主席迪拉克、全斯听协康提分会主席哈布阿拉吉、中斯友好人士、达尔马拉贾中学全体师生及社区居民2500余人出席开幕式，并参观开幕式图片展。

中国驻斯里兰卡使馆文化处为此次巡展发来贺词。斯里兰卡岛报、山地电台和康提电视台等媒体机构也对活动进行了全方位报道。

3、承办文化部及使馆提供的移动图书馆活动

受中国驻斯里兰卡大使馆委托，课堂于2009年11月承办了由文化部提供的移动图书馆在课堂展出借阅活动。该活动展出并借阅种中英文双语图书壹千册，课堂学员，兰比尼中学师生及周边社区居民参与了借阅活动。

4、知名学者演讲活动

⑴长期留学中国回国后从事媒体工作的卡萨帕·塞那拉特在课堂做两

චීන භාෂාව ඉගැන්වීම

2009 අගෝස්තු 8 දින බඳවා ගන්නා ලද පළමු ශිෂ්‍ය කණ්ඩායම විවිධ පාසල් වල අධ්‍යාපනය ලැබූ දරුවන් 45 දෙනෙකු ගෙන් සමන්විත විය. පළමු වැඩිහිටි ශිෂ්‍ය කණ්ඩායම එදිනම බඳවා ගත්හ.

ආරම්භයේදී පාඨමාලා 03ක් හඳුන්වා දෙන ලදී. ආරම්භකයන් සඳහා වන පදනම් පාඨමාලාවේ (Foundation Course) කාලය මාස 06කි. මාස 06 අවසානයේ දී මධ්‍යස්ථානය විසින් පවත්වන ලද විභාගයෙන් සමත් වන අය දෙවන අදියර වන අන්තර්මධ්‍ය (Intermediate Course) පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලබයි. එය එක් අවුරුදු පාඨමාලාවකි. ඉන් අනතුරුව පවත්වන සාධන පරීක්ෂණය සමත්වන අය තෙවන අදියර වන උසස් පාඨමාලාව (Advance Course) හැදෑරීම සඳහා සුදුසුකම් ලබයි. එක් අවුරුදු කාලයක් එම පාඨමාලාව හදාරා අවසාන විභාගය සඳහා පෙනී සිටිය යුතුය.

මෙම සෑම විභාගයක්ම සවන් දීමේ පරීක්ෂණයකින් ලිඛිත පරීක්ෂණයකින් හා කථන පරීක්ෂණයකින් සමන්විත විය. (Listening test, Written test and Oral test) එක් එක් පාඨමාලාව අවසානයේ පවත්වනු ලබන මෙම විභාග වලින් සමත් වන අය සඳහා සහතික පත්‍රයක් පිරිනමන ලද අතර චීනයෙන් පැමිණෙන නියෝජිතයකුගේ සහභාගීත්වයෙන් පවත්වනු ලබන උත්සවයකදී එය ප්‍රදානය කරන ලදී.

මේ ආකාරයට පාසල් සිසුන් මෙන්ම වයස අවුරුදු 60 පවා ඉක්මවූ වැඩිහිටියෝ ද චීන භාෂාව ඉගෙනීම සඳහා අප වෙත පැමිණියහ.

දිවයිනේ කොළඹ හා තදාසන්න ප්‍රදේශ වල පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද අනුරාධපුරය, කුරුණෑගල, කෑගල්ල, හැටන්, ගාල්ල, මාතර, රත්නපුරය වැනි ඈත ප්‍රදේශ වල සිට වැඩිහිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද මෙම මධ්‍යස්ථානයේ චීන භාෂාව හදාරනු ලැබේ. මේ හැර බෞද්ධ භික්ෂූන් වහන්සේ, විවධ ආගමික පූජකවරු විශ්ව විද්‍යාල සිසුන්, ජර්මනිය, ප්‍රංශය, ස්විස්ටර්ලන්තය, කොරියාව ආදී රටවල විදේශිකයෝ පවා මෙහි චීන භාෂාව හැදෑරීමට පැමිණියහ. මේ අය අතර රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවය කරන නිළධාරීන් මෙන්ම විවිධ වෘත්තිකයෝද සිටියහ. මෙකී පාඨමාලා වෙනුවෙන් (Grate Wall Chinese) පොත් පෙළ භාවිතා කරනු ලැබේ. චීන භාෂාව ඉගැන්වීම පුළුල් කරමින් විවිධ සේවාවන් වල හා වෘත්තීන් වල නියැලී සිටින අයට චීන භාෂාව ඉගැන්වීම සඳහා විශේෂ පාඨමාලා 2010 වර්ෂයේ සිට සැලසුම් කරනු ලැබීය.

01. සංචාරක මඟ පෙන්වන්නන් සඳහා චීන භාෂා පාඨමාලාව
02. මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නියුක්ත වුවන් සඳහා වූ සිව්මස් පාඨමාලාව
03. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියුතු වුවන් සඳහා වූ විශේෂ පාඨමාලාව ඊට නිදසුන් වේ.

අදාල ආයතන වලදී පවත්වන ලද, දැනටමත් පවත්වනු ලබන මෙම පාඨමාලා සඳහා නිදසුන් මෙසේය.

- Stone ‘n’ String (PVT) Ltd - කොළඹ - 2012
- බණ්ඩාරණායක අධ්‍යාපන මධ්‍යස්ථානය - BCIS - කොළඹ - 2010-2011
- CML - MTD Construction Ltd - කොළඹ -2011
- Amarican Eferd ආයතනය - හිඹුටාන - 2013

期《CRI国际广播发展现状暨当代中国文化》专题演讲。（2009年3月）

⑵时任斯里兰卡教育部教育发展司司长马德旺阿拉吉作《中国影响力及斯中文化交流》专题演讲（2009年5月）

⑶课堂与全国听协共同主办《中国改革开放30周年媒体座谈会》（2009年2月）

⑷我台全斯听协在科伦坡举办推介孔子课堂和中国文化活动（2009年7月）

2010年

1、“欢庆中国春节文化周”活动

课堂与国际台斯里兰卡全国听众协会于2010年2月11日至17日在斯里兰卡首都科伦坡、西北省库利亚皮迪亚市等地联合举办了为期一周的“欢庆中国春节文化周”活动。斯里兰卡西方省省督毛乌拉那、时任信息与传媒部长阿努拉·亚帕、时任斯里兰卡教育部教育发展司司长马德旺阿拉吉、中国驻斯大使馆文化处官员、时任全斯听协主席迪拉克·乌杜姆拉格、斯里兰卡各中小学师生代表孔子课堂学生、在斯中国留学生、斯中友好团体负责人等斯里兰卡各界近3000人次参与了“欢庆中国春节文化周”活动。

在一周时间内，课堂先后举办了“中文图书走进兰卡中小学--国际台斯里兰卡兰比尼广播孔子课堂移动图书馆赠阅活动”、“庆新春大型有奖知识竞赛”、“庆新春美丽中国图片展”、“ 包饺子--庆新春中国美食展示”、“庆新春中国传统文化展示--剪纸艺术与书法”等系列活动。本次“庆中国春节文化周”活动得到了中国驻斯里兰卡大使馆的大力协助和支持。斯里兰卡广播公司、斯里兰卡兰卡之声电台、《每日新闻》等斯里兰卡主流媒体对文化周进行了跟踪报道并给予了高度评价。

2、开设武术课程与体育汉语班

2010年3月8日，课堂与斯里兰卡中国武术联合会合作项目开始，该协会派出教练为课堂学员开设中国武术课。同年5月该协会会员参加了课堂举办的体育汉语班课程。

3、祈愿世博成功举办大型签名活动

2010年4月23日，课堂在兰比尼中学举行了“祝福上海世博”签名活动。国际台僧伽罗语部时任主任王晓东、国际台全斯听协主席、秘书长、斯中社会文化协会主席、斯中友好协会主席、斯中青年媒体协会秘书长、斯里兰卡西方省议会秘书长以及斯里兰卡各界友好人士600多人参加了本次签名集会并在巨幅条幅上签名，表达了对2010上海世博会成功举办的美好祝愿。



4、参展斯里兰卡首届中国教育展

2010年5月21日，课堂参加了中国国家留学基金委及驻斯使馆举办的斯里兰卡首届中国教育展。在为期两天的教育展中，课堂向斯里兰卡民众展出了课堂建设、教学及文化活动的各种宣传资料，并发放课堂简介、招生简章等宣传品，期间还隆重推出中国国家汉办与国际台共同策划出版的《每日汉语》(僧伽罗语版)图书。

中国驻斯大使、斯里兰卡高等教育部副部长、中国国家留学基金委秘书长等嘉宾莅临并参观了兰比尼广播孔子课堂展位。中国驻斯大使、斯里兰卡高等教育部副部长接受国际广播电台及当地媒体采访，高度评价了广播孔子课堂在斯里兰卡推广中国文化、促进两国人民相互了解、增进两国人民传统友谊所起到的桥梁作用。

- Oasis පාසල - බත්තරමුල්ල 2011-2014
- සංචාරක මග පෙන්වන්නන් සඳහා අන්තර්මාධ්‍ය පාඨමාලාව - 2013
- Sala Enterprices - රාජගිරිය - 2013-2014

මීට අමතරව 2010 වර්ෂයේ සිටම කොළඹ නාලන්ද විද්‍යාලයේත් හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලයේත් අප ආයතනය විසින් චීන භාෂාව උගන්වනු ලැබේ.

2014 වර්ෂයේ ජනවාරි මාසයේ සිට එතෙක් පවත්වන ලද පාඨමාලා, කාලීන අවශ්‍යතාවන් සැලකිල්ලට ගනිමින් සංශෝධනය කරන්නට යෙදුනි. අදියර 04ක් යටතේ නව පාඨමාලා සංවිධානය වී ඇති අතර චීන භාෂා ප්‍රවීණතා විභාග වලට (YCT හා HSK) යෝග්‍ය අයුරින් විෂය නිර්දේශ සැකසී ඇත. මෙම විභාග වලට අපේක්ෂකයන් ඉදිරිපත් කිරීමේ අනුමැතිය ලැබී ඇත්තේ කැළණිය විශ්ව විද්‍යාලයට හා අප ආයතනයට පමණි. අප විසින් 2010 වර්ෂයේ සිටම මෙකී විභාග සඳහා අපේක්ෂකයන් ඉදිරිපත් කරන ලද අතර මේ වන විට අපගේ පාඨමාලා වල මුඛ්‍ය ඉලක්කය චීනයේ හන්බන් ආයතනය සංවිධානය කරන HSK හා YCT විභාගයන්ය. මෙම ඉලක්ක ජය ගැනීම අරමුණු කරගත් පාඨමාලා 04ක් දැනට අප විසින් පවත්වනු ලැබේ.

වයස අවුරුදු 18ට අඩු ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා පැවැත්වෙන YCT විභාගය සඳහා පාඨමාලා 04ක්ද වැඩිහිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා පැවැත්වෙන HSK විභාගය සඳහා පාඨමාලා 04ක් ද ආයතනයේ ක්‍රියාත්මක වේ.

- Level 01 පාඨමාලා කාලය මාස 05කි.
- Level 02 පාඨමාලා කාලය මාස 05කි.
- Level 03 පාඨමාලා කාලය මාස 10කි.
- Level 04 පාඨමාලා කාලය මාස 10කි.

චීන භාෂා පිළිබඳ නිපුණතාවක් නොමැති අභ්‍යාසලාභීන් වෙත කථා කිරීම, ලිවීම, සවන්දීම හා කියවීම යන භාෂා කාර්‍යයන් ප්‍රගුණ කිරීම මෙම පාඨමාලා වල අරමුණයි.

මේ වන විට බඳවා ගන්නා ලද ශිෂ්‍ය කණ්ඩායම් සංඛ්‍යාව 52කි. ශිෂ්‍ය සංඛ්‍යාව දෙදහසකට අධිකය. ඔවුන් චතුර ලෙස චීන භාෂාව ව්‍යවහාර කරනු දැකීම අපට ඉමහත් සතුටකි.

ශිෂ්‍යත්ව වැඩසටහන

චීන භාෂාව ව්‍යවහාර කිරීමේ වැඩි නිපුණතාවක් දක්වන ලද ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සිය භාෂා ඥානය වර්ධනය කර ගැනීමට අත දීමක් වශයෙන් චීනයේ විශ්ව විද්‍යාල වලට ඇතුළත් කිරීම 2010 වර්ෂයේ සිට මේ දක්වාම අප ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

- 2010 - අනුරාධා සමන්මලී වේරපිටිය
  තරිඳු විජේරත්න
- 2011 - සඳුනි විජේතුංග
  සමෘද්ධි සමරසිංහ
- 2012 - පද්මී මහේෂිකා කුරගම
  තිළිණි ඉමේෂා සිල්වා
  පූර්ණිමා වීරසේකර
  චමිලි පීරිස්
- 2013 - තනුජා දුලංජලී ඒකනායක
  චාරුණි ලක්ෂාණි
  සමිත කසුන් බොතේජ
  එච්.ජී. අමාලි චතුරංගනී

2014 වර්ෂයේ ශිෂ්‍යත්ව සඳහා නිර්දේශිත අයදුම්පත් හන්බන් ආයතනය වෙත යවා ඇති අතර අධ්‍යයන කාලය සැප්තැම්බර් මස ආරම්භ වේ.

5、课堂杂志《友谊桥》季刊发行

2010年5月31日，课堂第一期学员结业典礼暨课堂杂志《友谊桥》首发仪式在课堂所在--科伦坡兰比尼中学隆重举行。时任中国驻斯里兰卡大使杨秀萍、时任斯里兰卡外交部副部长吉丹亚那·古纳瓦尔德那、西方省省督阿拉维·毛乌拉那、时任西方省议会秘书长内鲁卡·佩雷拉、国际台全斯听协负责人、中斯友好组织代表、科伦坡各中学校长代表及学生六百人左右参加了此次结业典礼暨杂志首发式。首期结业的35名学员获颁了结业证书，孔子课堂中斯方负责人向嘉宾们赠送了该课堂编撰出版的《友谊桥》汉语和僧伽罗语双语杂志。《友谊桥》杂志为在斯发行的唯一汉僧双语介绍中国教育文化的专门杂志。该季刊寄送斯文化、教育主要政府部门、中斯友好团体和斯首都各大中小学及外省主要重点学校。

6、组织学员参加《寄语世博》主题活动

2010年6月至7月，课堂通过讲座、图片展、视频等宣传形式为课堂学员介绍世博会，并发动学员制作相关世博手工、视频、音频作品。共制作音频、视频各20份，绘画、手工作品50余件。其中优秀作品在中国国际广播电台播出、展示。部分作品被上海世博博物馆收藏。

7、国际台王庚年台长视察课堂

2010年7月6日，由中国国际广播电台台长王庚年率领的国际台代表团一行视察了课堂。王庚年台长高度肯定了兰比尼广播孔子课堂在汉语教学和传播中国文化领域所取得的成绩，对课堂在促进中斯两国人民文化交流和友谊方面所做出的贡献表示赞赏。

出席活动的斯里兰卡教育部长邦杜拉·古纳瓦尔德纳发表讲话，对国际台多年来为促进两国文化交流的的贡献表示感谢。

国际台斯里兰卡听众协会，斯中青年媒体协会等分别向王庚年台长颁发荣誉奖项，以表彰他对促进中斯文化交流，两国媒体合作所出的贡献。这三个奖项分别是：纪念国际台僧伽罗语广播开播35周年听众之友最高荣誉奖、促进斯中社会文化合作奖、促进斯中媒体交流奖。

8、国庆文化推广系列活动

2010年9月21日至25日，为纪念中华人民共和国成立61周年，课堂策划组织了中华人民共和国成立61周年纪念大会、斯中友谊征文比赛、全斯中小学生中国知识竞赛及斯首个“中国日”活动。

时任中国驻斯里兰卡大使杨秀萍、斯里兰卡石油部部长、主要斯中友好组织代表、西方省重点中小学校长及学生代表、课堂学员、斯中友好人士及普通民众逾千人参加了此次活动，到场嘉宾对课堂在斯宣传中国文化推广汉语教育的工作表示高度肯定，并为课堂举办的斯中友谊征文比赛、中国知识竞赛获奖学生、听众颁奖。首届“中国日”活动由于在市中心露天广场举办，课堂学员表演的中国武术、歌舞节目、中国饮食文化展示等吸引了大批普通民众，收到良

මීට අමතරව අප ආයතනය විසින් සිව් අවුරුදු පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා 2013 වර්ෂයේ සිට ශිෂ්‍යත්ව ලබා දීමට නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

සංස්කෘතික වැඩසටහන්

Chinese Bridge

හන්බන් ආයතනය විසින් සංවිධානය කරනු ලබන ප්‍රධානතම වාර්ෂික තරඟයකි චීන පාලම (Chinese Bridge) වැඩසටහන. විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් හා ද්විතීක පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් වශයෙන් අදියර 02ක් යටතේ මෙම තරඟාවලිය වාර්ෂිකව පවත්වනු ලැබේ. අවසාන මහා තරඟය චීනයේදී පැවැත්වෙන අතර දේශීය තරඟකරුවන් තෝරා ගැනීමේ ප්‍රාථමික තරග පැවැත්වීමට ඒ ඒ රටවලට පවරා ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික තරගය පැවැත්වීමට ලුම්බිණි විද්‍යාලයීය කොන්ෆියුසියස් ආයතනය වෙත පවරා ඇත.

චීන තානාපති කාර්යාලයේ හා කැළණිය විශ්ව විද්‍යාලයේ සහයෙන් 2012 වර්ෂයේ සිට මේ දක්වාම අප විසින් මෙකී ප්‍රාථමික තරගය පවත්වා ඇත. ලිඛිත පරීක්ෂණයකින්, චීන භාෂාව පිළිබඳ කෙටි කථාවකින් හා චීන සංස්කෘතිකාංගයක් ඉදිරිපත් කිරීම මෙම ප්‍රාථමික තරගයට ඇතුළත් වේ. තරගයේ සමස්ථ ලකුණු ප්‍රතිශතය මත පළමුවැනියා අවසාන මහා තරගයට සහභාගී වීමටත් දෙවෙනියා හට එය නැරඹීම සඳහාත් චීනයට යාමට අවස්ථාව ලැබේ. 2014 වර්ෂයේ දී මේ වන විට කැළණිය විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂිකාවන් දෙදෙනෙකු 13වන Chinese Bridge අවසාන මහා තරගයට සුදුසුකම් ලබා ඇත.



ද්විතීක පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් පැවැත්වෙන Chinese Bridge තරඟාවලිය මෑතකදී ආරම්භ කරන ලද අතර අප ආයතනය 2012 වර්ෂයේ සිට එහි ප්‍රාථමික තරගය පවත්වනු ලබයි. වර්ෂයකට ශිෂ්‍ය ශිෂ්‍යාවන් 05 දෙනෙකුට චීනයේ පැවැත්වෙන අවසාන මහා තරගයට සහභාගී වීමට හා එය දැක බලා ගැනීමට අවස්ථාව ලැබේ. 2014 වර්ෂයේදී අපගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහභාගි වන්නේ 07 වන Chinese Bridge තරගයටය.

Winter Camp හා Summer Camp

හන්බන් ආයතනය සංවිධානය කරන ශීත කඳවුර හා ගිම්හාන කඳවුර සඳහා වාර්ෂිකව ලොව නන් දෙසින් විවිධ ජාතීන් චීනයේ දී ඒකරාශි වේ. අන්‍යෝන්‍ය අත්දැකීම් හා දැනුම හුවමාරු කර ගැනීමටත් විවිධ තරග වලට සම්බන්ධ වීමටත් මෙහිදී අවස්ථාව ලැබේ. මෙය අපගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට ලැබෙන කදිම අවස්ථාවකි.

"The Triple Show Tour"

2011 වර්ෂයේ වසන්ත උත්සවයට සමගාමීව UIBE චීන සංස්කෘතික කණ්ඩායම ශ්‍රී ලංකාවට පැමිණි අතර එහි සංවිධාන කටයුතු ඉටු කරන ලද්දේ අප ආයතනය විසිනි. ගීත ගායනා හා නර්තන ප්‍රසංග දෙකක්ද චීන ආර්ථිකය පිළිබඳ දේශන දෙකක්ද මෙම කණ්ඩායම විසින්

好宣传效果。

9、“相约上海--拥抱世界”大型图片巡展

2010年10月8日至14日，在中国驻斯里兰卡大使馆的大力支下，课堂在科伦坡及博拉卢高达市分别举办两次“相约上海--拥抱世界”大型图片展。展出的60余幅集中反映了2010年上海世博会盛况和最新中国城市生活面貌的图片。

时任使馆政务参赞韩涛、斯里兰卡外交部副部长、斯里兰卡司法部部长、西方省省督、斯里兰卡总统顾问、科伦坡前市长、斯里兰卡教育部门官员、斯里兰卡首任驻华大使夫人等中斯友好人士分别出席了图片展。图片展为斯里兰卡普通民众提供了了解中国、了解上海感知上海世博的机会。

斯里兰卡国家电视台、独立电视网、黄金电视台、斯里兰卡国家广播公司、兰卡岛报、宝石报、每日新闻、兰卡大地报等主流媒体对上述活动进行了报道。

2011年

1、欢乐春节中国文化周活动

2011年1月24日至2月10日，课堂面向斯国立中学及公众举办了“欢乐春节中国文化周活动”。系列活动包括“书法艺术、中国结及剪纸展示活动”“欢乐春节--中国北纬30°摄影图片展”“欢乐春节文化知识讲座及纪录片展映”“中华美食展示活动”等共计4场活动，斯教育部及政府部长数人、中斯友好组织代表、主流媒体代表、学生、家长等计1500余人次参加活动。

2、“三巡”项目

2011年2月9日，课堂承办了2011春节“三巡”斯里兰卡项目，包括两场大型公共演出及一场中国经济演讲。斯里兰卡教育部长等四位部长及多位斯政府高级官员、我驻斯临时代办韩涛及我驻斯使馆官员及斯里兰卡各主流媒体机构、各友好团体、课堂师生、听众代表等2000多人出席了活动。

3、第二届中国教育展

2011年5月14至15日，课堂应中国驻斯使馆邀请，参加了在斯首都科伦坡举办的第二届中国教育展。课堂向斯里兰卡民众千余人展出了课堂建设、汉语教学及中国文化宣传活动相关情况，接受民众有关汉__语学习、留学等信息咨询。

4、“汉语桥”比赛

2011年5月22日，课堂承办了“汉语桥”世界大学生中文比赛斯里兰卡地区预赛。中国驻斯里兰卡大使馆文化处官员、孔子课堂理事会成员及师生家长、汉语学习爱好者等一百余人观摩了比赛。同年，课堂还承办了“汉语桥”世界中学生中文比赛斯里兰卡地区预赛。

5、“我眼中的中国”大型征文比赛

2011年11月，课堂正式启动“我眼中的中国”大型征文比赛，此项活动为课堂与斯主流媒体Rivira报业集团合作，面向斯全境中小学生开展的征文活动。

ශ්‍රී ලංකාවේ දී පවත්වන ලදී. චීන ජාතික මහාචාර්යවරු දෙදෙනෙකු විසින් 2011 පෙබරවාරි 09වන දින කොළඹ 07 ලක්ෂ්මන් කදිරගාමර් අනුස්මරණ ශාලාවේදී චීන ආර්ථිකය හා ප්‍රාග්ධන වෙළඳපොළ පිළිබඳව දේශන 02ක් පැවැත්විය.

ශ්‍රී ලංකාවේ චීන තානාපති කාර්යාලයේ නිළධාරීන්ද උසස් රාජ්‍ය නිළධාරීන් මාධ්‍ය ආයතන, පාසල් සිසුන් ඇතුළු විශාල පිරිසක් මෙම දේශන වලට සවන් දුන්හ.

UIBE සංස්කෘතික කණ්ඩායම විසින් ලුම්බිණි රංග ශාලාවේදී ද ටවර්හෝල් රඟහලේදී ද Singing, Dancing Show 02ක් පවත්වන ලද අතර ශ්‍රී ලාංකීය විශාල පිරිසක් මෙය නැරඹූහ.

වසන්ත උත්සවය

ලුම්බිණි විද්‍යාලයීය CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය චීන ජාතිකයන් සමග සෑම වසරකම චීන අලුත් අවුරුද්ද හෙවත් වසන්ත උත්සවය සැමරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරයි. 2010 හා 2011 වර්ෂ වල දී කොළඹ ලුම්බිණි විද්‍යාලයේදීත්, සංඝමිත්තා බාලිකා විද්‍යාලයේදීත් නාලන්ද විද්‍යාලයේදීත් වසන්ත උත්සවය සැමරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කලේය. චීන ආහාර සැකසීම, වසන්ත උත්සවය පිළිබඳ තොරතුරු ඇතුළත් දේශනයක් පැවැත්වීම, කඩදාසි කලාව, අක්ෂර කලාව හා note කලාව යන සංස්කෘතික අංග මෙම උත්සව අවස්ථා වලදී ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක කළේය.

2012 වර්ෂයේදී වසන්ත උත්සවය සමරනු වස් වැල්ලවත්ත Chef lee Chinese restaurant හීදී ඩම්ප්ලින් සකස් කිරීම පිළිබඳ ප්‍රායෝගික වැඩමුළුවක් චීන තානාපති කාර්යාලයේ සංස්කෘතික අංශ ප්‍රධානී Shen Ming මහතාගේ ප්‍රධානත්වයෙන් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් පැවැත්වීය. එදිනම සවස් වරුවේ බස්නාහිර පළාතේ ආණ්ඩුකාරතුමා ගේ ප්‍රධානත්වයෙන් මහා සැමරුම් උත්සවයක් කොළඹ 03 Stone ‘n’ String ආයතනයේ දී පවත්වන ලදී.

2013 වර්ෂයේ දී වසන්ත උත්සව සැමරුම පවත්වන ලද්දේ ශ්‍රී ලංකා පදනම් ආයතනයේදීය. අධ්‍යාපන අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද මෙම උත්සවයට චීන තේ කලාව පිළිබඳව ප්‍රායෝගික වැඩසටහනක්ද ක්‍රියාත්මක කලේය.

2014 වර්ෂයේ වසන්ත උත්සවය සැමරීම Stone ‘n’ String ආයතනයේ දී පවත්වන ලදී. ප්‍රදර්ශනයක්ද ඇතුළත් වූ මෙම උත්සවය ශ්‍රී ලංකාවේ චීන තානාපති කාර්යාලයේ කොන්සල් තුමා, CRI විද්වත් පර්ෂද ප්‍රධානී වන්ෂියාඕතුං මහතා, සෞදි අරාබියේ හිටපු ශ්‍රී ලංකා තානාපති අලි සබ්‍රි මහතා ඇතුළු ප්‍රභූන් රාශියක් සහභාගීත්වයෙන් පැවැත්වීය. මෙම සියළු උත්සව අවස්ථාවන්හී දී ශ්‍රී ලංකාවේ චීන තානාපති කාර්යාලයේ සංස්කෘතික අංශය අනගි සහයක් ලබා දුනි.

වෙනත් ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා චීන ජනමාධ්‍ය සංගමයේ සංවිධානයෙන් ශ්‍රී ලංකාව තුළ චීන අධ්‍යාපන ප්‍රදර්ශන දෙකක් පවත්වන ලදී. ඉන් පළමුවැන්න 2010 මැයි මාසයේ දී බණ්ඩාරණායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී ද දෙවැන්න 2012 දී කොළඹ විශ්ව විද්‍යාලයේදී ද පවත්වනු ලැබීය. කොන්ෆියුසියස් පංති කාමරය වෙනුවෙන් මෙහි ප්‍රදර්ශන කුටියක් වෙන් කරන ලද අතර ශ්‍රී ලංකාවේ චීන තානාපති කාර්යාලයේ ආරාධනය පරිදී අප ඊට සහභාගී විය.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය ඊවිර පුවත්පත හා එක්ව සංවිධානය කරන ලද “China in my eyes” රචනා තරගය සම්බන්ධීකරණ කාර්යය අප ආයතනය වෙත පැවරුණි. දීප ව්‍යාප්තව පැවති මෙම රචනා තරගයේ ජයග්‍රාහකයන්

2012年

1、“欢乐春节中国文化周”系列活动

2012年1月16日，课堂举办了为期一周的“欢乐春节中国文化周”系列活动，包括三个项活动“中国美食展示会”、“中国春节起源及春节文化”讲座以及“欢乐春节联欢会”等系列中国文化推介活动。

斯里兰卡西方省省都阿拉维·毛乌拉那、中国驻斯里兰卡大使馆政务参赞任发强、使馆文化处主任沈鸣、时任国际台全斯听协主席迪拉克、时任斯里兰卡教育部教育司司长马德旺阿拉吉、兰比尼中学校长、我国驻斯里兰卡各中资机构代表、国际台斯里兰卡兰比尼广播孔子课堂学生,课堂理事会成员,我台斯里兰卡听众以及各界中斯友好人士等应邀参加上述各项活动。

本次中国文化系列推广活动向来宾介绍了中国春节传统文化习俗，与参加活动的中外嘉宾共同包饺子；介绍了中国书法艺术并当场进行书法展示，现场还进行了春节知识问答活动并为获奖者办发了由国家汉办及国际台联合策划出版的《每日汉语》（僧伽罗语版）图书及纪念品。

2、课堂结业典礼

2012年4月23日，课堂举办了2011-2012学年结业典礼。斯教育部部长邦杜拉·古纳瓦尔德纳、财政部副部长吉丹加纳·古纳瓦尔德那、时任中国驻斯里兰卡大使杨秀萍、国际台副总编辑尹力率国际台访斯代表团，广播孔子课堂师生代表、我台全斯听众协会代表和各界人士约三百人参加了此次活动。教育部部长、财政部副部长为结业学员颁发了结业证书、优秀学员奖。通过HSK汉语水平考试斯里兰卡首考的47人获颁了HSK资格证书。当天，国际台代表团还为 “我眼中的中国”大型征文比赛获奖者颁发了获奖证书及奖品。

3、“汉语桥”比赛

2012年5月20日，课堂承办了第11届“汉语桥”世界大学生中文比赛斯里兰卡地区预赛。中国驻斯里兰卡大使馆文化处官员、孔子课堂理事会成员及师生家长等各界人士观摩了比赛。同年7月15日，课堂还承办了第5届“汉语桥”世界中学生中文比赛斯里兰卡地区预赛。

4、汉语教材汉语教育推广培训班

2012年7月26日，课堂与斯里兰卡教育部合作，举办了汉语教材汉语教育推广培训班。全斯9省40名政府中学教师参加了该培训班。

5、纪念中斯建交55周年暨“米胶协定”签署60周年图片展

2012年8月3日，课堂举办了纪念中斯建交55周年暨“米胶协定”签署60周年图片展,中国驻斯里兰卡大使吴江浩参观图片展并视察了课堂。

2013年

1、“欢乐春节”庆祝活动

2013年2月6日，课堂在科伦坡国家教育培训中心举办了以中国茶文化为主题的春节庆祝活动。斯里兰卡教育部部长邦杜拉·古纳瓦尔德纳、“丝绸之路”斯中友好协会主席苏吉特·古纳拉特纳、兰比尼中学校长、广

වෙත ජය සංකේත පිරිනැමීමේ උත්සවය අප විසින් සංවිධානය කරන ලදී.

මධ්‍යස්ථානයේ චීන භාෂාව ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් තුළ අන්‍යෝන්‍ය උනන්දුව හා අවබෝධය වර්ධනය කරනු වස් 2010 හා 2011 වර්ෂ දෙකේදීම විනෝද චාරිකා සංවිධානය කරන ලදී. 2010 දී පාහියන්ගල ද 2011 දී ගාලු කොටුවද මෙම චාරිකා සඳහා යොදා ගන්නා ලදී. විනෝදය, අත්දැකීම් හා අධ්‍යාපනය වෙනුවෙන් ඉතා වටිනා අවස්ථාවක් වූ මෙම චාරිකා ප්‍රායෝගික දුෂ්කරතා නිසා පසු වර්ෂ වලදී ඉටු නොවිණ.

2010 ජූලි මස 02වන දින ගරු අග්‍රාමාත්‍ය දි.මු. ජයරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරන ලද CRI FM. 102 සේවය විවෘත කිරීමේ උත්සවය සංවිධානය කරන ලද්දේ කොන්ෆියුසියස් මධ්‍යස්ථානය විසිනි.

ශ්‍රී ලංකාවේ රජයේ පාසල් වල චීන භාෂාව ඉගැන්වීමේ අවශ්‍යතාව අප තේරුම් ගෙන සිටිමු. මේ සඳහා පාසල් ක්ෂේත්‍රය තුළ පෙළඹවීමක් ඇති කිරීමට අප කටයුතු කර ඇත. උතුරු හා නැගෙන හිර ඇතුළු ශ්‍රී ලංකාවේ පාසල් 40කින් අධ්‍යාපන අමාත්‍යංශය විසින් තෝරා දෙන ලද ගුරුභවතුන් 40දෙනෙකු වෙනුවෙන් වැඩමුළුවක් සංවිධානය කළෙමු. “Chinese teaching materials and education promotion work shop” නමින් නම් කළ මෙම වැඩමුළුව 2011 ජූලි මස 26 සහ 27 දෙදින පුරා පන්නිපිටිය සීඩා මධ්‍යස්ථානයේ දී අපගේ චීන ජාතික ගුරුභවතුන් විසින් පවත්වන ලදී.

චීන ආත්මාරක්ෂක සටන් කලාවක් මෙන්ම ජනප්‍රිය ක්‍රීඩාවක් ද වන වුෂු පුහුණු පංතියක් 2010 වර්ෂයේ දී ලුම්බිණි විද්‍යාලයේ දී ආරම්භ කලෙමු. අවට පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද සහභාගී වූ මෙම පුහුණු වැඩ සටහන ශ්‍රී ලංකා වුෂු සම්මේලනය සමග ඒකාබද්ධව පවත්වන ලදී.

කොන්ෆියුසියස් සමුළුව

විශ්ව විද්‍යාල හා පාසල් මුල් කරගත් කෝන්ෆියුසියස් මධ්‍යස්ථාන ලොව පුරා ව්‍යාප්තව ඇත. මෙවැනි මධ්‍යස්ථාන ආසියාවේ රටවල් 26 මධ්‍යස්ථාන 90ක් ද, අප්‍රිකාවේ රටවල් 14ක 21ක් ද, යුරෝපයේ රටවල් 26ක 107ක් ද, ඇමරිකා මහද්වීපයේ රටවල් 10ක 84ක් ද, ඕස්ට්‍රේලියාවේ හා නවසීලන්තයේ මධ්‍යස්ථාන 10ක් ද වශයෙන් 2008 වර්ෂය වන විට කොන්ෆියුසියස් මධ්‍යස්ථාන 312ක් මෙසේ ලොව පුරා ව්‍යාප්තව තිබුණි. ඇමරිකා එක්සත් ජනපදයේ පමණක් ඉන් 57ක් ද, එක්සත් රාජධානියේ 26ක්ද, ජපානයේ 17ක්ද පිහිටුවා තිබීමෙන් පෙනී යන්නේ ලොව සුපිරි බලවතුන් පවා චීන භාෂාව ඉගෙනීමේ වැදගත්කම තේරුම් ගෙන ඇති බවයි. මෙම මධ්‍යස්ථාන වල නියෝජිත සමුළුව 2006 වර්ෂයේදී ආරම්භ කර ඇත. වාර්ෂික ‘කොන්ෆියුසියස් ආයතන මූලස්ථාන සමුළුව’ නමින් හැඳින්වෙන මහා සමුළුව සෑම වර්ෂයකම දෙසැම්බර් ශීත සෘතුවේ බෙයිජිං නගරයේ දී චීන අධ්‍යාපන බලධාරීන්ගේ සහභාගීත්වය ද සහිතව පැවැත්වේ. 2008 වර්ෂයේ සිට අඛණ්ඩව ලුම්බිණි කොන්ෆියුසියස් මධ්‍යස්ථානයට ද මෙම සමුළුවට සහභාගී වීමේ අවස්ථාව ලැබී ඇත. මේ හේතු කොට ජාත්‍යන්තර වශයෙන් ලැබුණු අත්දැකීම් හා අවබෝධය සාර්ථකව මධ්‍යස්ථානය මෙහෙය වීමට පාදක වී ඇත.

චීන නිළධාරීන්ගේ නිරීක්ෂණ චාරිකා

2009 වර්ෂයේදී කොන්ෆියුසියස් මධ්‍යස්ථානය ආරම්භ කිරීමෙන් පසුව මෙම ආයතනයට සම්බන්ධ චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ (CRI) හා කොන්ෆියුසියස් මූලස්ථානයේ (HANBAN)

播孔子课堂师生代表、我台在斯听众协会代表和各界人士约二百人参加了此次活动。

当天，斯里兰卡国家电视台、独立电视台、《兰卡日报》、《每日新闻报》等斯里兰卡主流媒体均对活动进行了详尽报道。

2、国家汉办主任、孔子学院总干事许琳视察课堂

2013年2月26日，国家汉办主任许琳视察了课堂，观看了课堂教师的示范课并对孔子课堂给予高度评价。斯里兰卡教育部长邦杜拉·古纳瓦尔德纳、西方省省督阿拉维·毛乌拉那、民航部副部长吉当吉纳·古纳瓦尔德纳、中国驻斯里兰卡大使吴江浩等嘉宾出席了当天的活动。

许琳主任在参观兰比尼广播孔子课堂时表示，斯里兰卡广播孔子课堂自2009年7月成立以来迅速发展，斯里兰卡广播孔子课堂为斯里兰卡青少年学习中文、了解中国文化打开了一扇窗户。许琳主任表示，目前国家汉办已在110多个国家和地区建立起410多所孔子学院和550多家孔子课堂。兰比尼广播孔子课堂办得非常出色，对广播孔子学院取得的成绩表示祝贺。许琳主任还为课堂题词：“斯里兰卡兰比尼广播孔子课堂办得非常好，感谢中国国际广播电台，感谢斯里兰卡广播俱乐部的朋友们。中斯友谊万古长青！”



在欢迎典礼上，邦杜拉·古纳瓦尔德纳部长和课堂3位外方理事共同为许琳颁主任发了“中国文化国际推广奖”。许琳主任为斯里兰卡广播课堂通过HSK考试的学生颁发了证书，还观看了学员们表演的节目。

斯里兰卡广播孔子课堂师生和媒体代表共计400余人参加了当天的活动。斯里兰卡国家电视台、斯里兰卡广播公司、独立电视网、斯里兰卡报业集团旗下各大媒体都进行了详细报道。

3、“汉语桥”比赛

2013年5月18日，课堂承办了第12届“汉语桥”世界大学生中文比赛斯里兰卡地区预赛。中国驻斯里兰卡大使馆文化处官员、孔子课堂理事会成员及师生家长等各界人士观摩了比赛。同年7月27日，课堂还承办了第6届“汉语桥”世界中学生中文比赛斯里兰卡地区预赛。

4、“美丽中国”图片展

2013年8月1日，由课堂主办，斯里兰卡西北省库利亚皮蒂耶区阿拉莎学校协办的“美丽中国”图片展活动在该校成功举办。兰比尼广播孔子课堂理事会成员、库利亚皮蒂耶市教育机构负责人、该校师生代表等近百人参加了活动。

在活动现场，课堂还向阿拉莎学校优秀学生代表赠送了汉语学习书籍和礼品。在开幕式结束之后，现场嘉

නිලධාරීන් වරින් වර අධීක්ෂණ කටයුතු සඳහා පැමිණ ඇත. එකී අධීක්ෂණ චාරිකා අතර ඉතා වැදගත් වන්නේ කොන්ෆියුසියස් ආයතන මූලස්ථාන ප්‍රධානී හා අධ්‍යක්ෂ ජනරාල් ෂූලින් (Xu Lin) මැතිණිය ගේ පැමිණීමයි. 2013 පෙබරවාරි මස 26වන දින පැමිණි එතුමිය ගේ සම්ප්‍රාප්තිය සනිටුහන් කරමින් අධ්‍යාපන අමාත්‍ය තුමා ඇතුළු මැති ඇමතිවරුන්ගේ ද සහභාගීත්වය ද ඇතිව විශාල උත්සවයක් පවත්වන ලදී. මාධ්‍ය ආයතන 25කට වැඩි සංඛ්‍යාවක ගේ සහභාගීත්වයෙන් මාධ්‍ය හමුවක් ද පවත්වන ලදී.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ අධ්‍යක්ෂ ජනරාල් වන් ගන්නියන් මැතිතුමා මධ්‍යස්ථානය අධීක්ෂණය කිරීම සඳහා පැමිණීමද අතිශය වැදගත් සිදුවීමකි. 2010 මැයි මාසයේ 31වන දින එතුමාගේ සම්ප්‍රාප්තිය සිදුවූ අතර පළමු සහතික ප්‍රදානෝත්සවය පැවැත්වූයේ එතුමාගේ ප්‍රධානත්වයෙනි. මධ්‍යස්ථානයේ නිල ප්‍රකාශනය වූ 'මිතුරුසර' මංගල කලාපය එළිදැක්වීමද එදින සිදුවිය.

2010 වර්ෂයේ අප්‍රේල් මස 24වන දින පවත්වන ලද සහතික ප්‍රදානෝත්සවය චීන තානාපති යැන් ෂූපින් මැතිණියගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද අතර ඒ සඳහා චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ නියෝජ්‍ය ප්‍රධාන සංස්කාරක යින් ලී මහතා CRI ජපන් භාෂා අධ්‍යක්ෂ වන් ජියා පිං මහතා ද CRI ටෙලිවිෂන් නිෂ්පාදක නියෝජ්‍ය අධ්‍යක්ෂ හු යින් මහත්මිය ද CRI භාෂා ප්‍රවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ ලියු ෂන්යං මහතා ද යන දූත පිරිස සහභාගී වූහ.

ශ්‍රී ලංකාව හා චීනය අතර තානාපති සබඳතා පිහිටුවා වර්ෂ 60ක් සපිරීම හා දෙරට අතර අත්සන් කරන ලද රබර් හාල් ගිවිසුමට වසර 55ක් සපිරීම නිමිත්තෙන් 2012.08.03 දින ලුම්බිණි රඟහලේ දී ප්‍රදර්ශනයක් පවත්වන ලදී. මෙය විවෘත කිරීමට හා මධ්‍යස්ථානය නිරීක්ෂණය කිරීම සඳහා චීන තානාපති වූ ජියං හාවෝ මැතිතුමා ගේ පැමිණීම වැදගත් කොට සටහන් කරමි.

2014 වර්ෂයේ ජූලි මස 28වන දිනට පස්වන විය සපුරන ලුම්බිණි විද්‍යාලයීය CRI කොන්ෆියුසියස් පංති කාමරය ගතවූ පස් වසර තුළ මෙසේ විශිෂ්ඨ කාර්ය භාරයක් ඉටුකර ඇත. හන්බන් කොන්ෆියුසියස් මූලස්ථානය විසින් ලබා දෙන ලද නොමඳ සහය මීට අතිශයින් බලපා ඇත. මූල්‍ය අනුග්‍රහය හා උපදේශකත්වය මෙන්ම මේ වන විට වරින් වර චීන ජාතික ගුරු භවතුන් 07 දෙනෙකුගේ සේවය ලබා දී ඇත. චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය ද අපමණ මෙහෙවරක් ලබා දීම මෙකී සඵලතාවට බෙහෙවින් ඉවහල්ව ඇත. ඒ අතර පූර්ණකාලීනව සේවය කරන අධ්‍යක්ෂවරු දෙපළක් මේ වන විට පත්කර එවා ඇත. 2009.10.22 දින සිට සුන් ජියා ජියා මෙනවිය ද 2012 නොවැම්බර් 15වන දින සේවය සඳහා බූයුන් මහතා ද හන්බන් අනුමැතිය යටතේ පත්කර එවා ඇත.

ශ්‍රී ලංකාවේ චීන තානාපති කාර්යාලය මෙම මධ්‍යස්ථානයේ අධ්‍යාපන හා සංස්කෘතික ක්‍රියාදාමයන් සාර්ථක කර ගැනීම සඳහා අනගි දායකත්වයක් ලබා දී ඇත. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යංශය හා ලුම්බිණි විද්‍යාලය විසින් ලබා දුන් විවිධ සහයන් ද කෘතවේදීව සිහිපත් කළ යුතුය.

දුෂ්කරතා හා අපේක්ෂා

කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ සේවා පුළුල් කිරීමට පවතින ප්‍රබලතම දුෂ්කරතාව වන්නේ ගොඩනැගිලි ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීමයි. චීන භාෂාව ඉගෙනීම සඳහා පවතින ඉල්ලුම් සපුරාලීමටත් ගබඩා හා කාර්යාල පහසුකම් සඳහාත් මෙම තත්වය අහිතකර ලෙස බලපා ඇත.

අනාගතයේ දී දසවස් සැමරුම් උත්සවය එළැඹෙන විට මෙම තත්වය යහපත් අතට හැරෙනු ඇතැයි විශ්වාස කරමු.

宾和师生代表观看了图片展。本次展览展出的50幅图片展现的是当代中国人生活方式的经典瞬间，讲述了近几年来中国人民生活不断进步的历史，从不同侧面反映了中国在政治、经济、文化、社会等领域取得的成就。图片展活动将为进一步加强两国文化交流起到积极推动作用，斯里兰卡学生将增进对中国和中国人民的了解。

2014年

1、“欢乐春节”庆祝活动

2014年1月20日，课堂在科伦坡举办了春节庆祝活动。斯里兰卡民航部副部长吉坦吉纳·古纳瓦尔德纳、中国驻斯里兰卡大使馆政务参赞任发强、使馆文化处主任沈鸣、兰比尼中学校长、斯中友协、斯中媒体协会、斯中丝绸之路友好协会、斯中协会等友好协会负责人、驻斯各中资机构代表、兰比尼孔子课堂学生代表、课堂理事会成员、我台斯里兰卡听众以及各界中斯友好人士等200多人出席了上述庆祝活动。

此次春节庆祝活动介绍了中国春节传统文化习俗和春节美食，课堂学生表演了精彩的中国歌舞，并由使馆文化处沈鸣主任现场进行了书法展示，活动现场的气氛非常热烈。

当天，斯里兰卡国家电视台、独立电视台等主流媒体均对活动进行了报道。

2、“汉语桥”比赛

2014年4月6日，课堂承办了第13届“汉语桥”世界大学生中文比赛斯里兰卡地区预赛。中国驻斯里兰卡大使馆政务参赞任发强、孔子课堂理事会成员及师生家长等各界人士观摩了比赛。同年7月20日，课堂还承办了第7届“汉语桥”世界中学生中文比赛斯里兰卡地区预赛。

三、总结

五年来，课堂从无到有，逐步发展壮大，在斯里兰卡已发展成为一所具有很高知名度和广泛影响力的汉语教学机构。在五年的办学历程中，课堂已经走出了一条独具特色的发展之路，形成了适合斯里兰卡实情的办学体制和管理机制，汉语人才培养质量更是得到了社会的充分肯定和普遍好评。在这里，感谢一直以来大力支持课堂工作的各机构及个人，并祝愿课堂在未来的时间里取得更大的成绩。

චීන භාෂාව සහ සංස්කෘතිය ශ්‍රී ලාංකිකයන් වෙත දායාද කරන චීන භාෂා තක්සලාව

ශ්‍රී ලාංකීය ප්‍රජාවට, චීන භාෂාව සහ සංස්කෘතිය ඉගෙනීමේ මං පෙත් විවර කළ, කොළඹ ලුම්බිණි විද්‍යාල පරිශ්‍රයේ පිහිටුවා ඇති CRI - කොන්ෆියුසියස් මධ්‍යස්ථානයට වසර පහක් සපිරේ. චීන භාෂාව හා සංස්කෘතිය ඉගෙනීමේ අවස්ථා උදා කර දෙමින්, චීන - ශ්‍රී ලංකා දෙරට අතර අධ්‍යාපන, සංස්කෘතික ඇතුලු විවිධ ක්ෂෙත්‍ර වල හුවමාරු ඉඩ ප්‍රස්ථා ලබාදීමට මෙම මධ්‍යස්ථානය විශාල කාර්යභාරයක් ඉටු කර ඇත.

චීනයේ හන්බන් හෙවත් කොන්ෆියුසියස් ආයතන මූලස්ථානයේ උපදේශක දායකත්වය මත චීනයේ රාජ්‍ය ගුවන් විදුලි සේවය වන, චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය විසින් ශ්‍රී ලංකාවට ලබා දී ඇති ලුම්බිණි CRI - කොන්ෆියුසියස් මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාවේ පාසලක පිහිටුවා ඇති එකම කොන්ෆියුසියස් භාෂා මධ්‍යස්ථානය ද වේ.

මෘදුකාංග, මල්ටි මීඩියා ඇතුලු නවීන ඉගෙනුම් මෙවලම් වලින් සමන්විත පංති කාමර පහසුකම් හා සියළුම සිසුන්ට පෞද්ගලිකව පරිගණක පරිහරණය කිරීමේ පහසුකම් ද මධ්‍යස්ථානය සතුවේ. අප රටේ දැනට ක්‍රියාත්මක වන, විධිමත් චීන භාෂා අධ්‍යයන මධ්‍යස්ථානය ලෙස පාසල් හා උසස් අධ්‍යාපනය හදාරන සිසුන්ට චීන භාෂාව හා සංස්කෘතිය අධ්‍යයනය කිරීමට මෙන්ම චීන භාෂාව ඉගෙනීමේ අවශ්‍යතාව ඇති වැඩිහිටි අය සඳහා ද අප මධ්‍යස්ථානයෙන් සේවා සැපයේ. චීන භාෂාව ලිවීම, කියවීම, කථාකිරීම සහ සවන්දීම යන සිව් වැදෑරුම් භාෂා නිපුණතාවන් ලබා දීම අරමුණු කොටගෙන මෙහි පාඨමාලා සැලසුම් කොට ඇත. ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියකට සුදුසු ලෙස සැකසු පෙළපොත්, ගුරු අත්පොත් මෙන්ම අධ්‍යයනය සඳහා අවශ්‍යවන පොත්පත් වලින් යුත් පුස්තකාල පහසුකම් වලින්ද මධ්‍යස්ථානය සමන්විතය.

සිසුන් හා වැඩිහිටියන් සඳහා විවිධ මට්ටමේ පාඨමාලා සැලසුම් කොට ඇත. චීනයේ කොන්ෆියුසියස් මූලස්ථානය (හන්බන්) මඟින් පාඨමාලා සඳහා ප්‍රවීනතා විභාග පවත්වනු ලබන අතර ජාත්‍යන්තරව පිළිගන්නා ප්‍රවීනතා සහතික නිකුත් කෙරේ.

චීන භාෂාව පිළිබඳ පාඨමාලා සාර්ථකව අවසන් කරන සිසුන්ට චීනයේ කෙටිකාලීන අධ්‍යයන චාරිකා මෙන්ම චීන විශ්ව විද්‍යාල වල උසස් අධ්‍යාපනය සඳහා පූර්ණ කාලීන ශිෂ්‍යත්ව ලබා ගැනීමටද අවස්ථාව හිමිවේ. උපාධි, පශ්චාත් උපාධි පාඨමාලා සඳහාද චීන විශ්ව විද්‍යාල වලට සිසුන් යොමු කිරීමට අප මධ්‍යස්ථානය කටයුතු කරයි. දැනටමත් විශාල සිසුන් සංඛ්‍යාවකට ඉහත ප්‍රතිලාභ ලබා දී තිබේ.

අප මධ්‍යස්ථානයෙන් චීන භාෂාව හා සංස්කෘතිය අධ්‍යයනය කරනු ලබන ඔබට තවත් ප්‍රතිලාභ රැසක් ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා විවෘත වේ. ශ්‍රී ලංකා - චීන දෙරට අතර සංස්කෘතික හුවමාරු සඳහා සහභාගි වීම මෙන්ම කොන්ෆියුසියස් ආයතනය වාර්ෂිකව සංවිධානය කරන ජාත්‍යන්තර තරඟ වලට සහ චීනයේ පැවැත්වෙන විවිධ වැඩ මුළු වලට, සංස්කෘතික වැඩ සටහන් වලට සහභාගි වීමට ඔබට අවස්ථා හිමිවේ. ලොව පුරා විවිධ රට වල චීන භාෂාව හා සංස්කෘතිය හදාරන සිසුන් සමඟ අත්දැකීම් හුවමාරු කර ගැනීමටත් ජාත්‍යන්තර අත්දැකීම් විඳ ගැනීමටත් ලැබෙන දුර්ලභ අවස්ථා එමඟින් ඔබට උදා වේ.

ගෝලීය සංවර්ධනය, සන්නිවේදන තාක්ෂණයේ විශ්මිත පරිවර්ථනය වැනි හේතු නිසා දැනුම පදනම් කොටගත් සංවර්ධනය සහ දැනුම් සමාජයක් පිළිබඳ ලෝකයේ අවධානය යොමු වී ඇත.

වත්මන් ලෝක තත්වය හමුවේ ඇති නව අභියෝග වලට සාර්ථකව මුහුණ දෙමින් චීනය ලොව ප්‍රමුඛ රාජ්‍යයක් ලෙස සියලුම ක්ෂෙත්‍ර වල ජයග්‍රහණ අත්කර ගනිමින් සිටී.

චීන - ශ්‍රී ලංකා දෙරට අතර පවතින දිගු කාලීන සාම්ප්‍රදායික මිත්‍රත්වය හා රාජ්‍ය තාන්ත්‍රික බැඳීම් වර්තමානයේ සීඝ්‍රයෙන් වර්ධනය වී ඇති අතර චීනය ශ්‍රී ලංකාව කෙරෙහි දක්වන ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ සහයෝගිතාව අප රටට විශාල ශක්තියක් වී ඇත. අප රටේ ජාතික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය යටිතල පහසුකම් වැඩි දියුණු කරලීමට ආධාර සපයන ප්‍රධාන රට බවට අද චීනය පත්ව සිටී. ක්ෂෙත්‍ර රැසක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කෙරෙන ප්‍රධාන ව්‍යාපෘති සඳහා චීන රජයේ සෘජු දායකත්වය ලැබී තිබේ.

සීඝ්‍රයෙන් වර්ධනය වන දෙරටේ මිත්‍ර සබඳතා ප්‍රවර්ධනයට චීන භාෂාව මෙවලමක් ලෙස යොදා ගැනීමට අපේ අවධානය අවශ්‍ය තරම් යොමු වී නොමැත. එහෙත් චීන

ජාතිකයින්ට සිංහල භාෂාව ප්‍රගුණ කොට, දෙරටේ මිත්‍ර සබඳතා සඳහා සිංහල භාෂාව යොදා ගැනීමට චීනය කටයුතු කළේ 1957 දී දෙරට අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා නිල වශයෙන් ආරම්භ වීමත් සමඟය.

දීර්ඝ ඉතිහාසයක් ඇති, ලිඛිත භාෂාවක් ලෙස සංවර්ධනය වූ ලෝකයේ ඉතා පරිණත භාෂාව ලෙස චීන භාෂාව පිලිගැනේ. ලොව වැඩිම පිරිසක් භාවිතා කරන භාෂාව වන්නේද චීන භාෂාවයි. ජාත්‍යන්තර භාෂාවක් ලෙස චීන භාෂාව ඉගෙන ගැනීම තුලින් ශ්‍රී ලාංකිකයන් වන අපට අලුත් ක්ෂේත්‍ර රැසක පුළුල් ඉඩ ප්‍රස්ථා විවර කර ගැනීමට අවස්ථාව උදා වේ. මව්බසට අමතරව විදේශ අධ්‍යාපන, වෘත්තීය, වාණිජ වැනි විවිධ ක්ෂේත්‍ර වලට ප්‍රවේශ වීමේ පුළුල් ඉඩකඩ අද විවෘත වී තිබේ. ඉදිරියේදී මේ තත්වය සීඝ්‍රයෙන් වර්ධන වනු ඇත.

ශ්‍රී ලංකා - චීන මිත්‍රත්වය හා සහයෝගීතාව වර්ධනය කිරීම සඳහා සංවිධානගතව කටයුතු කළ අපි චීන භාෂාව ඉගෙන ගැනීමෙන් විපුල ඵල ලබා දීමට ඇති ඉඩකඩ, ශ්‍රී ලාංකිකයන්ට විවර කර දීමට විවිධ උත්සාහයන් ගත්තෙමු. 1998 වර්ෂයේ බස්නාහිර පලාත තුල චීන භාෂා ව්‍යාපෘතියක් ආරම්භ කළේය. 2003 වර්ෂයේ කොළඹ සී.ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නන්ගර විද්‍යාලයේ චීන භාෂා පංතියක් ආරම්භ කළේය. අපගේ අවශ්‍යතාව ඉටු නොවීය.

මා වසර දහයකට ආසන්න කාලයක් විධායක සභාපති ධුරය දැරූ ශ්‍රී ලංකා - චීන සාමජ හා සංස්කෘතික සහයෝගිතා සංගමය චීන භාෂා මධ්‍යස්ථානයක් අප රටට ලබා ගැනීම සඳහා චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සහාය පැතීය. චීන ජාත්‍යන්තර ගුවන් විදුලි සිංහල සේවයේ ශ්‍රී ලාංකීය අසන්නන්ගේ සංගමයද සහාය විය. මිත්‍ර සබඳතා වර්ධන කෙරේ චීන භාෂාව ඉගැන්වීමේ අවශ්‍යතාවය මැනවින් වටහාගත් චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය අපගේ ඉල්ලීම ඉටුකිරීමට ඉදිරිපත් විය. එවකට චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවාව භාර අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ වංෂියාඕතුං මහතාගේ සෘජු මැදිහත්වීම නිසා චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය චීන භාෂා මධ්‍යස්ථානයක් අප රටට ලබා දීමට කටයුතු සම්පාදනය කළේය.

ශ්‍රී ලංකිකයින්ට චීන භාෂාව ඉගැන්වීමේ කටයුතු විධිමත්ව ආරම්භ කිරීමේ, අපගේ දීර්ඝකාලීන අභිලාෂය මල්ඵල ගන්වමින් 2009 වර්ෂයේ CRI - කොන්ෆියුසියස් මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ ආරම්භ කිරීමට අපට හැකිවිය. චීන මිත්‍රත්වය වෙනුවෙන් අප සංගමය සමඟ දීර්ඝ කාලීනව කටයුතු කළ මිත්‍ර පාසලක් වූ කොළඹ 5. ලුම්බිණි විද්‍යාල පරිශ්‍රයේ CRI - කොන්ෆියුසියස් මධ්‍යස්ථානය එසේ ආරම්භ විය. මේ සඳහා දායක වූ චීනයේ හන්බන් හෙවත් කොන්ෆියුසියස් මූලස්ථානයටත්, චීන ජාත්‍යන්තර ගුවන් විදුලියටත් එහි සිංහල සේවයටත්, අප සංගමයේ හා ගුවන් විදුලි අසන්නන්ගේ සංගමයේ සියලු දෙනාටත් කෘතවේදීව ස්තූතිය පුද කරන්නෙමි. මෙම කාර්යේ භාරධූර වගකීම ඉටුකළ චීන ජාත්‍යන්තර ගුවන් විදුලි සිංහල සේවා අධ්‍යක්ෂ වංෂියාඕතුං මහතාට විශේෂයෙන් ස්තූති කරමි.

අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය යටතේ චීන ශ්‍රී ලංකා නියෝජිතයින් ගෙන් යුත් පාලක මණ්ඩලයක් යටතේ මෙම මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ. ගෙවී ගිය වසර පහක කාලය තුල අප ලැබූ අත්දැකීම් ඉදිරියේදී මධ්‍යස්ථානයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනය සඳහා යොදා ගැනීමේ අභියෝගය අප ඉදිරියේ ඇත. පලාත් මට්ටමින් පාසල් හා විවිධ ආයතන සඳහා පංති ආරම්භ කිරීමට වැඩි ඉල්ලුමක් ඇත. ඒ සඳහා සුදුසු දේශීය හා විදේශීය ගුරු මණ්ඩල සපයා ගත යුතුය. මේ සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවේ. චීන භාෂා ගුරු සංචිතයක් ඇති කොට, ප්‍රාදේශීය අවශ්‍යතා සඳහා යොදා ගැනීම ප්‍රායෝගිකව කළ හැකි විසඳුමකි.

විභාග දෙපාර්තමේන්තුව මඟින් භාෂා විෂයක් ලෙස අ.පො.ස උ.පෙළ විභාගය සඳහා චීන භාෂාව අනුමත කොට ඇත. අ.පො.ස. පෙළ විභාගය සඳහා චීන භාෂාව අතිරේක භාෂාවක් ලෙස හැදෑරීමට අවස්ථාව ලබා දීමට කටයුතු සම්පාදනය කිරීම වැදගත්ය. දැනට කැළණිය සහ සබරගමුව විශ්ව විද්‍යාල වල විෂයක් ලෙස චීන භාෂාව හදාරන සිසුන්ට චීන භාෂාව සඳහා ගුරු වෘත්තීයේ යෙදීමට අවස්ථාව ලබා දීමෙන් ජාතික වශයෙන් චීන භාෂාව ව්‍යාප්ත කිරීමට විශාල පිටුවහලක් සැපයේ.

චීන භාෂාව ඉගෙන ගැනීමටත්, චීන සංස්කෘතිය හැදෑරීමටත් උනන්දුවක් දක්වන සියලු දෙනාට අපගේ මධ්‍යස්ථානය සමඟ සම්බන්ධ විය හැකිය. දැනුම පදනම් කොටගත් තරඟකාරී ලෝකයට පිවිසෙන්නට චීන භාෂාව ඉගෙන ගන්නා ලෙස ඔබ සැමට ආරාධනා කරන්නෙමි.

නන්දසේන මදවන්ආරච්චි
උප සභාපති - ලුම්බිණි CRI - කොන්ෆියුසියස් මධ්‍යස්ථානය
හිටපු නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් - අධ්‍යාපන අමාත්‍යාංශය.

ඇගයීම්

ලෝකයේ පැරණිතම භාෂාවන්ගෙන් එකක් වූ චීන භාෂාව පිළිබඳ අධ්‍යයනයේ මුල් අඩිතාලම මා විසින් ලබා ගත්තේ කැළණිය විශ්ව විද්‍යාලයෙනි. චීනයට ගොස් අධ්‍යාපනය ලැබීමෙන් චීන භාෂාව පිළිබඳව ලබා ගත හැකි දැනුම විශාලය යන්න මා සිතේ වර්ධනය වූයෙන් ශ්‍රී ලංකාවේ පවතින චීන භාෂාව උගන්වන්නා වූ අයතනයක් වන ලුම්බිණි CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය වෙත මා පියමැන්නේ ඉන් ශිෂ්‍යත්වයක් ලබා චීනයට ගොස් අධ්‍යාපනය ලැබීමේ දැඩි ආශාවෙනි. ලුම්බිණි CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ විශේෂත්වය නම් එහි පැමිණෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් දක්ෂතාවයන් දක්වන්නන් තෝරා ශිෂ්‍යත්ව ප්‍රදානය කර චීනයට ගොස් අධ්‍යාපනය ලැබීමට අවස්ථාව සලස්වා දීමයි. ලුම්බිණි විද්‍යාලයීය CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානයෙන් චීන භාෂාව හැදෑරීමට මා වඩාත් උනන්දු වූයේ ඉහත කරුණ හේතුවෙන් වූ අතර එය මාගේ අරමුණ සමඟද වඩාත් සහසම්බන්ධ විය.

ලුම්බිණි විද්‍යාලයීය CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය මගින් ලබා දෙන ශිෂ්‍යත්වයක් ලබා 2012 සැප්තැම්බර් 01වන දින චීනයට යාමට තරම් මා භාග්‍යවන්තයෙක් වූයෙමි. අධ්‍යයන වසරක ශිෂ්‍යත්වයක් ලැබූ මම චීනයේ Guangxi විශ්ව විද්‍යාලයේ අධ්‍යනය කටයුතු සඳහා සම්බන්ධ වූයේ ලුම්බිණි විද්‍යාලයීය CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානයට ස්තූතිවන්ත වන්නටය.
මාස දහයක් පුරා මා චීනයේ අධ්‍යයන කටයුතු වල නිරත වූ අතර එම කාල වකවානුව තුළදී චීනයේ බොහෝ ස්ථානවල සංචාරය කලෙමි. එම ස්ථාන අතුරින් බීජිං හි චීන මහා ප්‍රාකාරය, Tian'anmen චතුරස්‍රය, Guangzhou කුළුණ හා Guilin යන ස්ථාන හා ප්‍රදේශයන් මා සිත වඩාත් ඇබැඳ ගන්නා ලදී.
චීනයේ ශීත සෘතු නිවාඩුවේදී Henan පළාතේ පිහිටි ෂාඔලිං පන්සලෙන් කුන්ග් ෆූ සටන් කලාව ප්‍රගුණ කළ අතර එමගින් මාගේ ජීවිතයට හරවත් අත්දැකීම් රැසක් ද එකතුකර ගතිමි.

ලෝකයේ වැඩිම ජනගහණයක් වෙසෙන රට වන චීනයේ ඉතාමත් කාර්යක්ෂම හා කඩිසර ජාතියක් ජීවත්වන අතර ඔවුන්ගේ එම වටිනාකම් මාගේ ජීවිතය තුළටද එකතු කර ගැනීමේ භාග්‍ය එරටෙහි අධ්‍යාපනය ලැබීමට යාම හේතුවෙන් මටද උදා විය.

2013 ජූලි 14වන දින මා මෙරටට පැමිණියේ චීනයෙන් ලද අධ්‍යාපනික මෙන්ම සාමාජීය අත්දැකීම් විශාල සංඛ්‍යාවක් ද සමඟින් වූ අතර ඒ සඳහා මා හට මහත් පිටුබලයක් ලබා දුන්, 2014 ජූලි 28 දිනට පුරා වර්ෂයක් සම්පූර්ණ වන ලුම්බිණි විද්‍යාලයීය CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය වෙත මාගේ සුභාශිංසනද මේ සමගින් යොමු කරන්නෙමි.

ආර්. චමිලි පීරිස්

මගේ නම චමෝද් මධුෂ ලක්ෂාන්. මම දැනට ලුම්බිණි විද්‍යාලයේ 11 ශ්‍රේණියේ ඉගෙනුම ලබනවා. මම චීනයට ගියේ 2013 වර්ෂයේදීය. ඒ 6වෙන චීන පාලම තරගයට සහභාගි වීමටයි.

ලාල් ගුරුතුමාගේ ප්‍රධානත්වයෙන් පසන්, ලසෝදා, රවිඳු සහ මම 2013 ඔක්තොම්බර් 22වන දින චීනයේ බෙයිජිං ගුවන් තොටුපලෙන් අප චීනයට පා තැබුවෙමු. එය අප සියලු දෙනාගේම ප්‍රථම චීන සංචාරයයි. එම ගුවන් තොටුපලේදී හන්බන් ආයතනයේ නිළධාරියෙකු විසින් අපව සාදරයෙන් පිළිගන්නා ලදී.

අප චීන මහා ප්‍රාකාරය, තියෙන්-අන්-මන් චතුරස්‍රය, ගිම්හාන මාලිගාව, කුරුළු කැදැල්ල ඔලිම්පික් ක්‍රීඩාගාරය ද නැරඹීමට ගියෙමු. මෙහිදී ද අපට මග පෙන්වන ලද්දේ ජෝන් නම් චීන ජාතික තරුණයකි.

අපි චීනයේ හන්බන් ආයතනය ද නැරඹීමට ගියෙමු. පසුව අප Yunnan පළාතේ Kunming ප්‍රදේශයට ගියෙමු. එහිදී අපට මග පෙන්වන ලද්දේ Zhang ගුරුතුමිය ඇතුළු ඇගේ සිසු කණ්ඩායමයි. එහිදී අප Yunnan විශ්ව විද්‍යාලයේදී හා Yunnan ද්විතීක අධ්‍යාපන පාසලෙන් චීන භාෂාව ඉගෙන ගත්තෙමු. පසුව Yunnan ඉපැරණි නගරය හා Yunnan ජාතික කෞතුකාගාරය නැරඹීමට ගියෙමු. එහිදී අපට චීන සාම්ප්‍රදායික ආහාර අනුභවයටද අවස්ථාවක් ලැබුණි.

මෙම ගමනේ දී අපත් සමග තරග කිරීමට පැමිණි රටවල් 86ක මිතුරු මිතුරියන් හමු විය. එහි පැමිණ සිටි සියලු දෙනාගේ කථාබහට ලක් වූයේ චීනයේ වත්මන් දියුණුවයි. එය අතිශය ඉහල මට්ටමේ දියුණුවකි.

දෙසතියකට පසු චීනයේ සොඳුරු මතකයන් සමගින් අප නොවැම්බර් 05වන දින ලංකාවට නැවත පැමිණියෙමු.

අවසාන වශයෙන් වුවද මහත් අභිමානයෙන් මතක් කළ යුතු කරුණකි, මෙලෙස මා හට චීනයේ සංචාරය කිරීමට හැකි වූයේ ලුම්බිණි විද්‍යාලයේ CRI මධ්‍යස්ථානයෙනි. එය මගේ ජීවිතය නව මාවතකට හරවන ලදී. ළමුන්ට චීන භාෂාව උගන්වමින් ක්‍ෂෘෂ මධ්‍යස්ථානය යන ගමන් මගේ 5වන සංවත්සරයට සුභ පතන්නේ හදපිරි සතුටිනි.

R.A. **චමෝද් මධුෂ**

ආයුබෝවන් ප්‍රිය මිතුරනි, මගේ නම චාරුණී ලක්ෂානි රණසිංහ. මම චීන භාෂා මධ්‍යසථානයට එක් වූයේ 2009 වරරේදීය. එදා මෙදා තුර මා ආ ගමන් මඟ ඔබට දිග හරිමි මෙසේ.

ලුම්බිණි විද්‍යාලයේ CRI චීන භාෂා මධ්‍යස්ථානයේ චීන භාෂාව හැදෑරීමට එක් වූ දා සිට මා හට නව ජීවයක් ලැබිණි. එහිදී මා හට චීන භාෂාවේ පළමු අඩිතාලම කියා දුන්නේ සුරම්‍යා ගුරු මහත්මියයි. එදා ඇය සංහල භාෂාව චතුර ලෙස හැසුරූ ආකාරය දැක මමද චීන භාෂාව මැනවින් හැදෑරීමට අධිෂ්ඨාන කරගතිමි. එහිදී මා ඇතුලු සියලු සිසු දරුවන්ට CRI භාෂා මධ්‍යස්ථානටය් අමරජීව ගුරුතුමා ඇතුළු සියලු ගරුමහත්ම මහත්මීන්ගෙන්ද සියලු දෙනාගෙන්ද නොමද සහයෝගය අමතක කළ නොහැක.

2011 වසර මාගේ ජීවිතයේ විශේෂ හැරවුම් ලක්ෂයක් විය. ඒ මන්ද යත් ලුම්බිණි CRI චීන භාෂා මධ්‍යස්ථානයේ පැවැත්වුණු චීන පාලම තරඟයට මා සහභාගී වූ අතර එහිදී ලැබූ ජයග්‍රහණය නිසා මා හට චීනයේ සංචාරයට අවස්ථාවක් උදාවිය. මා ඇතුළු අශානි, චතුරංග හා තේජාන් යන සොහොයුරු සොහොරියන්ද එම වටිනා අවස්ථාව උදාවිය.

ඒ අනුව 2011.10.13 නදීකා ගුරුතුමියගේ මගපෙන්වීම යටතේ චීනයට පා තැබුවේය. එහිදි අපව ඉතා ගෞරවයෙන් පිළිගත් අතර එහිදී අපට දැකගත හැකි වූයේ

චීන පාලම තරගයට සහභාගී වීමට පැමිණි තවත් අපවන් විශාල විදේශ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ය. බෙයිජින් නුවරදී අප සියලු දෙනාටම චීන මහා ප්‍රාකාරය, ගිම්හාන මාලිගය ආදී සුවිශේෂ ඓතිහාසික ස්ථාන නැරඹීමට වරම් හිමිවිය. එමෙන්ම අපට සැමවිටම ශක්තියක් වන Hanban ආයතනයේද සුන්දරත්වය දැකබලා ගැනීමට හැකිවිය. ඉන්පසුව අප චීනයේ Chongqing ප්‍රදේශයේ සංචාරයට අවස්ථාව හිමිවිය. අප එහි තිබූ විශ්ව විද්‍යාල වලටද, එහිදී සංවිධානය කර තිබූ තරග වලටද සහභාගී විය. එමෙන්ම ප්‍රථම වතාවට මා හට චීනයේ සුන්දරත්වය කියාපාන සංකේතයක් වන පැන්ඩා දැකබලා ගැනීමට හැකිවිය. එමෙන්ම එම සංචාරය තුලින් මා හට මිතුරු මිතුරියන් රාශියක් දැන හඳුනා ගැනීමට හැකි විය. එමෙන්ම චීන ඉතිහාසය හා සංස්කෘතිය පිළිබඳ හොඳ අවබෝධයක් ලබා ගැනීමටද හැකිවිය. 2011.11.02 අප නැවත ලංකාවට පැමිණියෙමු.

2012 වසරේ වසරේදීද මාගේ සිහිනය යලි සැබෑවිය. මන්ද යත් ලංකාවේ පැවති 5වන චීන පාලම තරඟයේ දෙවන ස්ථානය ලබා චීන පාලම තරඟයට ලංකාව නියෝජනය කරමින් සහභාගි වීමට අවස්ථාව හිමිවිය. එහිදී මා හා විහංගා සොහොයුරිය චීන පාලම තරඟයටද, තනූජා හා යසි සොහොයුරියන්ට චීන සංචාරයට වරම් හිමිවිය. ඒ අනුව සියළු දෙනාගේ ආශිර්වාදය මැද 2012. 11. 14 වන දින රේඛාණි ගුරුතුමියගේ මඟපෙන්වීම යටතේ චීනයේ බෙයිජිං නුවරට ළඟාවිය. එහිදී මෙවරද සියලු දෙනාවද හරසරින් පිළිගැනීමට ඔවුන් අමතක නොකළාය. එහිදී නැවත වරක් චීන මහාප්‍රාකාරය හා ගිම්හාන මාළිගයේ සුන්දරත්වය දැකබලා ගැනීමට මා හට අවස්ථාව හිමි විය. ඉන් පසු අප සියලු දෙනා Kuming ප්‍රදේශයට පැමිණියෙමු. එහිදී නැවත වරක් බොහෝ මිතුරු මිතුරියන් මුන ගැසීමටද ඔවුන් සමඟ අත්දැකීම් බෙදාගැනීමටද හැකිවිය. ණමපසබට විශ්ව විද්‍යාලයේදී අපගේ තරඟ පැවැත්වුනු අතර එහිදී අපගේ චීන භාෂා හැකියාව හා දක්ෂතා ඉදිරිපත් කිරීමට අවස්ථාවක් උදාවිය. එමෙන්ම එම ප්‍රදේශයට අවේනික වූ විවිධ ක්‍රීඩා ඉසව් වලට සහභාගී වීමටද ඒවායින් අලුත් අත්දැකීම් ලබාගැනීමටද හැකිවිය. එමෙන්ම එම ප්‍රදේශයේ විවිධ සුන්දර ස්ථාන කරා අපව රැගෙන යාමට මෙවරද ඔවුන් අමතක නොකළේය. කෙසේ වෙතත් 2012. 11. 26 නැවත අප ලංකාවට පැමිණියේ ජයග්‍රහණ, දැණුම හා අත්දැකීම් සමඟය.

2013 වසරේ මා චීන විශ්ව විද්‍යාලයේ උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්වයකට අයදුම් කළ අතර එහිදී මා ඇතුළු තවත් සිව්දෙනෙකුට guangxi ප්‍රදේශයේ ඉතා ප්‍රචලිත විශ්ව විද්‍යාලයක් වන guangxi විශ්ව විද්‍යාලයේ චීන භාෂා අධ්‍යයනට අවස්ථාව හිමි විය. විදේශ රටවල් ගණනාවකින්ම විශාල සිසු සිසුවියන් පිරිසක් එම විශ්ව විද්‍යාලයේ චීන භාෂාව හැදෑරීමට එක්වී තිබුණි.

එහිදී අපට චීන භාෂාව පළපුරුදු ගුරුමහත්ම මහත්මීන් විසින් ඉගැන්වූ අතර ප්‍රධාන පැතිකඩ 4ක් ඔස්සේ අපගේ දැණුම වර්ධනය කිරීමට ඔවුන් උත්සුක විය. එමෙන්ම එම කාලය තුල චීනයේ එක් සුන්දර ස්ථානයක් වන Guilin ප්‍රදේශය නැරඹීමට විශ්ව විද්‍යාලය විසින් අපහට අවස්ථාව උදාකර දෙන ලදී මාස හයක කාලය ඉතා කෙටි වුවද එමගින් ජීවිතයට මා එක් කරගත් දෑ අපමණය. මගේ අරමුණ වන්නේ චීනයට ගොස් චීන භාෂාව වැඩිදුර අධ්‍යයනය කොට චීන භාෂා ගුරුවරියක් වීමයි.

මේ සියලු අත්දැකීම් වලින් මාහට හැඟුණු දෙයක් වන්නේ චීනය හා ශ්‍රී ලංකාව අතර මිත්‍රත්වය පවතින්නේ ඈත අතීතයේ පටන්ය. එම මිත්‍රත්වය තවත් ශක්තිමත් කිරීමට වෙර දරන ලුම්බිණි විද්‍යාලයේ CRI චීන භාෂා මධ්‍යස්ථානයට මා ස්තූති වන්ත වන අතර තවත් මා වැනි ශිෂ්‍යාවන්ට චීන භාෂාව හැදෑරීමට මහඟු තෝතැන්නක් වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ස්තූතියි

මීට චාරුණී ලක්ෂාණි.

Learning a language brings us wisdom as well as joy. “Chinese bridge”, Chinese proficiency competition for foreign secondary school student is a plat form of inter cultural exchange for students from various countries to display their Chinese proficiency, to understand each other. It’s more than competition.

I who studied Chinese language in the preliminary stage in 2012, competed at the national level selection for the international 5th Chinese bridge competition. Not a pin of an idea has in me to win, but most wanted to participate.

For a destined fate mixed with luck and talent, I was able to crown the all island 1st place, I was given the responsibility of representing my mother lanka, in the international 5th Chinese bridge competition.

Time clasped with the warmth of the happy news and everything was organized for our departure, on the 14th of November 2012. Our duration of stay was for nearly 12 days Witch was filled with a hectic day planning.

As said by one of the greatest Chinese philosophers, ‘Time and tide wait for no man!’ This was a motto engraved in all hearts of the people in china. They dare not waste a single second of time for no reason. This was inculcated in all of our minds, as our programmer adjourned on the very next morning.

During the 1st week of our stay, we travelled to witness the glory of the wanders of the world. The great wall and the Forbidden City in Beijing, the Yunnan nationalities museum, and the stone forest in Yunnan province are some of the eye cached sceneries One of the events that pricked my hart was the grand original nature song and dance medley ‘Shangri-La – dynamic Yunnan’ it was indeed a stunning performance!

During this time I was offered with the opportunity of meeting new friends from all over the world. An unbreakable friendship to be said.

The organizing ability of the Chinese people should be surely rewarded, since our programmer went perfectly in parallel with the scheduled timetable. Their hospitality ever since we landed was a remarkable quality, of them.

On one hand, it was an honor for us to work with them and on the other; this event gave us a fistful of undying memories and a bunch of experiences.

When recalling all these memories. The CRI Confucius Centre at Lumbini College is a place never to be forgotten it laid the foundation to be me today – to be a Chinese language learner.

If not for the CRI Confucius centre, as all young stars hare heaps of dreams, my journey to china would hare been just as such another dream.

The centre gyres us an immense support in rendering the Chinese knowledge to all the students in the best and in the perfect manners.

I wish to pay my heartiest gratitude to the CRI Confucius Centre at Lumbini College, on this very special day.

So, as I pen off my thoughts, “Acquire the will to accomplish all of worth while”

G.M.Hasini Vihanga Gunadasa

2010 වසරේ නොවැම්බර් මාසයේ දී ලුම්බිණි විද්‍යාලයේ CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ මා ඇතුලු සිසුන් පස් දෙනෙකුට චීනයේ බෙයිජිං නුවර සංචාරයකට භාග්‍යමත් අවස්ථාවක් උදාවිය. චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවයේ පූර්ණ අනුග්‍රහයෙන් යුතුව අපේ CRI කොන්ෆියුසියස් පන්තියේ පවත්වන ලද චීනය පිළිබඳ දැනුම මිනුම හා චීන සංස්කෘතිකාංග එළි දැක්වීමේ දක්ෂතාවය මත තෝරා ගත් අප සිසුන් පස් දෙනෙකුට පුරා දින දහයක කාලයක් බෙයිජිං හි සංචාරයක නිරත වීමට වාසනාවන්ත වීමු. එම සංචාරය තුළ දී චීන මහා ප්‍රාකාරය තරණය කොට සැබෑ මිනිසුන් වූ අප ගිම්හාන මාළිගය, තියෑන් අන් මන් චතුරශ්‍රය, ලාමා පන්සල, අටමස්ථානය, ඔලිම්පික් ගම්මානය, ජුනි 01 වැනිදා පාසල, හන්බන් කොන්ෆියුසියස් මූලස්ථානය මෙන්ම චීන ජාත්‍යන්තර ගුවන් විදුලි මූලස්ථානය නරඹා චීනයේ අද්විතීය කලා ශිල්ප, සංස්කෘතිකාංග, පෞඩ ඉතිහාසයක ශ්‍රී විභූතිය මෙන්ම, සුවිශේෂී වූ ආහාර සංස්කෘතියක පහස ලැබීමට හැකි විය.

චීන භාෂා පාඩම් අතරේ ගුරුවරුන්ගෙන් අසා සිතින් විඳි සුන්දර චීනයේ ගතින් ඇවිද නෙතින් සිරි බලන්නට අනුපමේය භාග්‍යයක් උදා කරමින් 2012 සැප්තැම්බර් මස නැවතත් භාෂා ශිෂ්‍යත්වයක් හිමිව හූබෙයි පළාතේ Three Gorges විශ්ව විද්‍යාලයේ සය මාසිකව අධ්‍යාපනය හැදෑරීමට අවස්ථාව උදා විය. එහිදී ලංකාවේදී ලද භාෂා දැනුම වැඩි දියුණු කරමින් චීන අක්ෂර කලාව, කථන හැකියාව, චීන චිත්‍ර කැටයම් මෙන්ම සංස්කෘතිකාංගවල පුහුණුව ලබමින් චීන ජාතිකයින්ගේ විස්මිත හැකියාවන් වූ Three Gorges තාප බලාගාරය, San xia Ren Jia, Qing jia hua lang හි විස්කම් නැරඹීමට අවස්ථාවට ලදිමි. අධ්‍යාපනය ලබන අතරේ ම Chong Qing හි දී විශ්ව විද්‍යාලය, කෞතුකාගාරය, Expo උද්‍යානය, නාට්‍ය ශාලාවන්හිදී චීන ගෘහ නිර්මාණ ශිල්පය මෙන්ම, උද්‍යාන සැලසුම්කරණය පිළිබඳ මනා දැනුමක් විනෝදයක් ලද හැකි විය. නේපාල, කොරියානු, ඇමරිකානු, පෝලන්ත, ස්විට්සර්ලන්ත එකම ශ්‍රී ලාංකික ශිෂ්‍යයාවෝ මා හටත්, අපගේ දැනුම අදහස් හුවමාරු කර ගැනීමට උපකාරී වූ එකම විශ්ව භාෂාව වූයේ චීන භාෂාවයි.

ලුම්බිණි CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය දැයේ දූ දරුවනට විශ්ව භාෂාව සපයන විශ්ව ගම්මානයක් ම වන්නේ චීන ජාතික ගුරුවරු සේම චීන භාෂා සිංහල ගුරුභවතුන්ගේ සේවය දරුවන්ට ලබා දෙන අතර, නූතන පරිගණක තාක්ෂණය ද, චීන භාෂා පුස්තකාලයක පරිශීලනය ද, ලබා දී හැකියා දක්ෂතා අධ්‍යාපන මට්ටම් අධීක්ෂණය කර ඒවාට උපරිම අගයක් ලබාදෙන නිසා ය.

චීන භාෂාව ගැන දැනුමක් නොමැතිව කොන්ෆියුසියස් මධ්‍යස්ථානයට එක් වූ මා ලද දැනුමත් එසේ ලද අගනාකම් මත එකම රටකදී එකිනෙකට වෙනස්වූ ප්‍රදේශ තුනකදී විවිධ අත්දැකීම් ලබන්නටත් චීන ජාතිකයන් තුලවූ කරුණාව ආදරය සෙනෙහස සමගිය විඳින්නටත්, වර්තමාන ලෝකයේ බලවතෙකු වූ චීන මහජන සමූහාණ්ඩුවේ දියුණුව සියැසින්ම අත්විඳීමටත් හැකි විය. එසේ ලද දැනුම අද දිනයේ දී චීන භාෂා ගුරුවරියක් ව චීන භාෂා මාර්ගෝපදේශිකාවක් මෙන්ම, පරිවර්තිකාවක් ලෙස මගේ චීන භාෂා සේවය මගේ මව්රටට ලබා දීමට තරම් මා වාසනාවන්ත වූයේ ලුම්බිණි විද්‍යාලයේ CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානයෙන් ලද ආභාෂය හා පිටුවහලයි.

සෑම අවස්ථාවකදී ම අපගේ ආරක්ෂාව වෙනුවෙන් ද, අධ්‍යාපන කටයුතු කෙරෙහි ද, ජේ.ජී. අමරජීව ගුරු පියාණනුත්, සුන් පියාජියා ගුරුතුමිය ඇතුළු නිළධාරී මණ්ඩලයත් චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ වං ෂියාඕ තුං මහතා, ෂෙංලි මහත්මිය ඇතුළු සියලු දෙනා මඟ පෙන්වූහ.

පද්මි මහේෂිකා කූරගම

මා ලුම්බිණි විද්‍යාලයීය CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානයට ඇතුළත් වූයේ අ.පො.ස උසස්පෙළ විභාගයට සූදානම්ව සිටි කාලයේදීය. උසස් පෙළට පෙනී සිටියාට පසුව මෙම මධ්‍යස්ථානයෙන් මා හට වැඩිදුරට චීන භාෂාව ඉගෙනීමේ පාඨමාලාවක් සඳහා වසරක කාලයකට චීනයේ නැන්නිං (Nanning) නගරයේ ග්වංෂී (Guangxi) විශ්ව විද්‍යාලයට ශිෂ්‍යත්වයක් ලබා දුන් අතර ඒ සඳහා 2011 අගෝස්තු මස 31 වන දින පිටත් වී එම පාඨමාලාව සඳහා ඇතුලත් විය.

අප වැනි විදේශීය සිසුන්ට චීන භාෂාව ඉගෙනීම ඉතා පහසු කරවීමට එම විශ්ව විද්‍යාලයේ ගුරු භවතුන් විශාල පරිශ්‍රමයක් දරන බව මට අවබෝධ විය. ඉගෙනීමට අමතරව, නිවාඩුවක් ලැබුණු අවස්ථා වලදී මට චීනයේ ග්ඉලින් (Guilin) ෂැංහයි (Shanghai) හා හයිනන් (Hainan) වැනි අනෙකුත් ස්ථානවල සංචාරය කිරීමේ අවස්ථාව උදා විය. එලෙස සංචාරය කිරීමෙන් චීන ජාතිකයන් හා ඔවුන්ගේ ජීවන රටාවන් පිළිබඳ බොහෝ වෙනස්කම් දැකගත හැකිය. මා චීනයේ සිටි කාලය තුළදී විදේශීය සිසු සිසුවියන් හා චීන සිසු සිසුවියන් දැන හැඳින ගැනීමේ වාසනාවද මට ලැබුණි.

එහිදී මට හමුවූ පුද්ගලයන් ඉතා මිත්‍රශීලී කරුණාවන්ත පිරිසක් වීම සතුටට කරුණකි. මට වසරකින් චීන භාෂාව පමණක් නොව එහි සංස්කෘතිය සහ ජනයා පිළිබඳව ද යම්තාක් දුරට අවබෝධයක් ලබා ගැනීමට හැකි විය.

මෙම අත්දැකීමෙන් පසුව මා ලුම්බිණි CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය දකින්නේ චීන භාෂාව හා චීන සංස්කෘතිය පිළිබඳ දැඩි උනන්දුවක් අක්වන සිසු සිසුවියන් හට ඒ සඳහා ඔවුන්ට අවස්ථාව උදා කරදෙන කදිම ස්ථානයක් බවයි.

සඳනි විජේතුංග

චීනයට ගිය දිනය හා එහි ගත කළ කාල වකවානුව

2013.10.20 දින සිට 2013.11.04 දක්වා සති දෙකක කාලයකි.

එසේ යාමට හේතුව හා ගිය ස්ථාන

චීන පාලම තරගය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට එහි ගිය අතර චීනයේ බෙයිජිං නුවර හා කුන්මින් ප්‍රදේශයේ සංචාරය කරන ලදී.

චීනයේ සංචාරය කරන ලද ස්ථාන සහ සම්බන්ධ වූ ආයතන

චීන මහා ප්‍රාකාරය, හන්බන් ආයතනය සහ චීන ජාතික පවුලක් සමග පැය කිහිපයක් ගත කළ අතර චීනයේ පාසලක ද පැය කිහිපයක් ගත කරනු ලැබුවා. එසේම චීන ජාතිකයන්ට අයත් විවිධ සංස්කෘතික අංගයන් දැක බලා ගැනීමට පමණක් නොව ඔවුන් සමග එකතු වී ඒවායෙහි නියැලීමටද අවස්ථාව ලැබුණා.

චීනය පිළිබඳ මාගේ පෞද්ගලික අදහස් හා සිතුම් පැතුම්

අප කළ චීන සංචාරයේ පළමු දින තුන අප විසින් ගත කරනු ලැබූයේ චීනයේ අගනුවර වන බෙයිජිං නුවරයි. එහිදී චීනයේ සංස්කෘතික වටිනාකමකින් යුතු බොහෝ දෑ දැක බලා ගැනීමට මා හට හැකියාව ලැබුණා. මාගේ මතකයේ රුඳුනා වූ විශේෂිතම ස්ථානය චීන මහා ප්‍රාකාරයයි. ලෝක පුදුමයන් ද අතරට එක්වන එය සියසින්ම දැක ගැනීමට හැකිවීම මා ලද භාග්‍යකි. එමෙන්ම ලෝකය පුරා රටවල චීන භාෂාව ඉගැන්වීම සඳහා ක්‍රියා කරනා මූලස්ථානය වන හන්බන් මධ්‍යස්ථානයට යාමට සහ එය නැරඹීම අප කළ තවත් කාර්යයකි.

ඉන්පසුව අපගේ සංචාරයේ ඉතිරි දින කිහිපය ගත කළේ චීනයේ ඉදිවූ නවීන නගරයක් වන කුන්මින් හීදීය. එහිදී පවත්වන ලද ආරම්භක උත්සවයේ දී හන්බන් මධ්‍යස්ථානය විසින් සියළුම රටවලින් පැමිණි සිසුන්ව ඉතාම උණුසුම් අයුරින් පිළිගනු ලැබුවා. එහිදී අපගේ රටේ ජාතික ඇඳුමද ප්‍රදර්ශනය කිරීමට අපට හැකියාව ලැබුණා. අප සහභාගී වූ තරඟය අදියර හතරකින් සමන්විත වූවා. මේ සියළුම කාර්යන්හිදී අප හට හන්බන් ආයතනය නියෝජනය කරන

ලද ගුරුවරුන්ගෙන් සහ ගුරුවරියන්ගෙන් ද එමෙන්ම චීනයේ විශ්ව විද්‍යාලවල ඉගෙනුම ලබන සිසුන්ගෙන් ද ලැබුණා වූ සහයෝගය ස්තූති පූර්වකව මතක් කළ යුතුයි.

තරගයේ නියැලෙන අතරතුර කාලයේ අප හට චීන ජාතික පවුලක් සමග ඔවුන්ගේ නිවසේ පැය කිහිපයක් ගත කිරීමටත් ඉන් පසුව ඔවුන් සමග ආහාර වේලක් රස බැලීමටත් පමණක් නොව ඔවුන් සමග ඒ අවට ප්‍රදේශයේ සංචාරය කිරීමටත් අපට හැකියාව ලැබුණා. අප චීනයේ ඇති සුවිසල් පාසලක ගත කළ කාලය ද ඉතාම විනෝද ජනකය. එහිදී චීන ජාතික ළමුන් සමග විවිධ අත්කම් නිර්මාණ වලද අප නියැලුණා.

මෙම තරගය සඳහා ලොව පුරා රටවල් හැටකට අධික ප්‍රමාණයක් සහභාගී වූවා. ඒ සියලුම දෙනා සමග මා ගත කළ කාලය අතරතුරදී ඔවුන් හොඳින් දැන හදුනා ගැනීමටත් ඔවුන් සමග එකතු වී චීනයට අයත් විවිධ සංස්කෘතික අංගයන්හි නියැලීමටත් අවස්ථාව ලැබුණා. ඔවුන් සමග අදටත් මම මිතුරුකම් පවත්වනු ලබනවා. චීනයේ සිටි කාලයේ ඊට අයත් නොයෙක් ආගමික ස්ථාන, සංස්කෘතික වටිනාකමකින් යුත් ස්ථාන, කෞතුකාගාර දැක බලා ගැනීම පමණක් නොව ඔවුන්ට අයත් විවද ආහාර වර්ග රස බැලීමටත් හැකි වූවා.

සමාප්ති උළෙල ඉතාම විචිත්‍රවත් වු එකක් වුණා. දින ගණනක් ඒ සඳහා පුහුණු වීම් කළ අතර එහිදී අපට ඉතා කැපවීමෙන් සහ උද්යෝගයෙන් චීන ජාතිකයන් සමග වැඩ කටයුතු කරනා ආකාරය ඉගෙන ගැනීමට ලැබුණා. මමද එහිදී මොණර නර්ථන අංගයකට සහභාගී වුණා. සියල්ල අවසානයේ ඉතාම දුකක් දැණුනු අවස්ථාව වූයේ අපගේ යහළු යෙහෙළියන්ගෙන් වෙන්වීමයි. චීනයේ ගත කළ සති දෙකක කාලය ඉතාම වැදගත් සහ වටින එකක් වූ අතර චීන මධ්‍යස්ථානය විසින් අපිව පාලනය කරනු ලැබුවේ ඉතාම ආදරයෙන් සහ කැපවීමකිනි.

මේ සියලුම දේ තුළින් මාගේ චීන භාෂාව ඉගෙන ගැනීමට ඇති ආශාව සහ උනන්දුව තවත් වැඩි කරනු ලැබුවා. එසේ කළ හන්බන් මධ්‍යස්ථානයට සහ එහිදී අප හට උදවි උපකාර කළ චීන ජාතිකයින්ට සහ විවිධ රටවලින් පැමිණි යහළු යෙහෙළියන් මා මතක් කරන්නේ ඉතාම ස්තූති පූර්වකවයි.

ලුම්බිණි කොන්ෆියුසියස් මධ්‍යස්ථානය මා දකින ආකාරය

මෙවන් අති විශාල තරගයකට සහභාගී වීමට මා හට හැකියාව ලැබුනේ මම ලුම්බිණි CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානයට සම්බන්ධ වී එහි පාඨමාලාවන් හැදෑරූ නිසාවෙනි. චීන පාලම තරගයට සහභාගී වීම සඳහා අප කොන්ෆියුසියස් මධ්‍යස්ථානය විසින් පවත්වනු ලැබූ තරගයේ දෙවන ස්ථානය ලබා ගැනීමට මට හැකියාව ලැබුණා. ඉන් පසුව තරගය සඳහා මා පුහුණු කරනු ලැබුවේ ද එම මධ්‍යස්ථානය විසිනි. මධ්‍යස්ථානය භාර අමරජීව ගුරු පියාණන් සහ අනෙකුත් සියළුම ගුරුවරුන් ඒ සඳහා මා හට දැක්වූ සහයෝගය ඉතාම අගනා අතර මම ඔවුන්ට ඉතා ස්තූතිවන්ත වෙනවා. සියලුම නවීන පහසුකම් වලින් සපිරි ලුම්බිණි CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය චීන භාෂාව ඉගෙනීමට අප තුළ ඇති රුචිකත්වය වැඩි කරනවා.

එබැවින් මම චීන භාෂාව ඉගෙන ගන්නා මෙම ලුම්බිණි කොන්ෆියුසියස් මධ්‍යස්ථානය හට මගේ නොමඳ ප්‍රණාමය පුද කර සිටිනවා. එමෙන්ම අපගේ මධ්‍යස්ථානය දිනෙන් දින දියුණු වීමටත් තවත් ළමුන් හට චීන භාෂාව ඉගෙනීමටත් චීන සංස්කෘතිය පිළිබඳ හොඳ දැනුමක් ලබා ගැනීමටත් මෙය හොද තෝතැන්නක් වේවා යැයි මම සුභ පතමි.

ලසෝධා පියුමි සිරිවර්ධන

කොළඹ ලුම්බිණි විද්‍යාලයේ 2009 වර්ෂයේ ජූලි මස පිහිටුවන ලද CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ ප්‍රථම ශිෂ්‍ය කණ්ඩායමේ සාමාජිකයකු වූ මා හට ඇත්තේ ඉමහත් සතුටක් හා ආඩම්බරයකි. මධ්‍යස්ථානයේ ආරම්භයේ සිට සිව් වසරකට වැඩි කාලයක් චීන භාෂාව හැදෑරීමට ලැබීම මෙන්ම, මධ්‍යස්ථානය මගින් සංවිධානය කරන ලද බොහෝ සංස්කෘතික උත්සව සහ ක්‍රියාකාරකම් සඳහා සහභාගි වීමට ලැබීම මා ලද භාග්‍යයක් යයි මම සිතමි. ආරම්භක අවස්ථාවේ සිට මධ්‍යස්ථානය මේ දක්වා පැමිණි ගමන් මඟ ඉතා ප්‍රශංසනීයය. චීනය හා ශ්‍රී ලංකාව අතර අතීතයේ සිට පවතින දැඩි මිත්‍රත්වය හා සහයෝගිත්වයේ ප්‍රතිඵලයක් ලෙස ගොඩනැගුණු කොන්ෆියුසියස් මධ්‍යස්ථානය මේ වන විට ශ්‍රී ලංකාවේ චීන භාෂාව ඉගෙනීමට ඇති ප්‍රධානතම ආයතනය බවට පත්ව ඇත. චීනය වැනි ඉතා සීඝ්‍රයෙන් සංවර්ධනය වෙමින් පවතින රටක් සමඟ සබඳකම් පැවැත්වීමේදී, එහි සංස්කෘතිය මෙන්ම භාෂාව පිළිබඳ අවබෝධයක් ලබා තිබීම ඉතා අත්‍යාවශ්‍ය කරුණකි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ චීන භාෂාව ඉගෙනීමට කැමැත්තෙන් සිටින්නන් සහ ඉගෙන ගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යමින් පවතී. CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය මේ සඳහා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර, මධ්‍යස්ථානය මගින් ලබා දෙන පහසුකම් ඉතා ඉහළ මට්ටමක පැවතීම ද සුවිශේෂය. මීට අමතරව වයස් භේදයකින් තොරව ඕනෑම අයෙකුට මධ්‍යස්ථානයේ අධ්‍යාපනය ලැබීමට ඉඩ ප්‍රස්ථාව ලබා තිබීමද අනිවාර්යයෙන් සඳහන් කළ යුතු කරුණකි.

මධ්‍යස්ථානය ආරම්භ කළ දින සිට මේ දක්වා චීනයේ සංචාරය කිරීමට ශ්‍රී ලාංකිකයන්ට විවිධ අවස්ථාවන් ලබාදීමට කටයුතු කර ඇත. 2010 වර්ෂයේ ලුම්බිණි කොන්ෆියුසියස් මධ්‍යස්ථානය මගින් චීනයේ විශ්ව විද්‍යාලයක මාස හයක පමණ කාලයක් චීන භාෂාව හැදෑරීම සඳහා ප්‍රදානය කරන ලද ප්‍රථම ශිෂ්‍යත්වයට තේරී පත් වීම මාගේ අධ්‍යාපන ක්‍රියාවලියේ තවත් කඩ ඉමක් විය. 2010 සැප්තැම්බර් මස, චීනයේ දකුණු දිග, හුබෙයි ප්‍රදේශයේ සන්ෂියා විශ්ව විද්‍යාලයට යාම මාගේ සිහිනය යථාර්ථයක් බවට පත් වූ දිනයක් විය. සංස්කෘතියෙන් උදාර වූ චීන ගුරුවරුන්ගෙන් හා ශිෂ්‍යයන්ගෙන් මා ලැබූ අත්දැකීම් හා දැනුම් සම්භාරය අති විශාලය. ලෝකයේ විවිධ රටවලින් පැමිණි විවිධ වූ සහෝදර සිසුන්ගෙන් ලැබුණු සහයෝගය මා දැඩි ලෙස අගය කරමි. විශ්ව විද්‍යාලය තුල විෂය කටයුතු මෙන්ම විෂය සමගාමී ක්‍රියාකාරකම් වලට ද මම එකලෙස සහභාගි වීමි. ස්වභාවික සෞන්දර්යය අතින් සන්ෂියා ප්‍රදේශය ඉතා සුන්දර වූ ප්‍රදේශයකි. සන්ෂියා දියඇල්ල, චිංජියන්ග් ගංගාව, චෂි ගම්මානය මාගේ සුන්දර මතකයන් අතර තවමත් සිහිවටන සේ රැඳී පවතී.

2013 වර්ෂයේ මධ්‍යස්ථානයේ චීන භාෂා උසස් පාඨමාලාව හදාරමින් සිටින කාලය තුළ මා හට නැවත වරක් චීනයේ සංචාරය කිරීමට අවස්ථාවක් ලැබිණ. මෙය චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය හා හන්බන් ආයතනයේ සහයෝගිතාවය මත පිහිටුවන ලද කොන්ෆියුසියස් මධ්‍යස්ථානයන්හි සාර්ථකව සැමරීම සඳහා පවත්වන ලද ''වසන්ත කඳවුර'' නමින් හැඳින්විණ. සති දෙකකට ආසන්න කාලයක් තුළ චීනයේ බෙයිජිං නගරය හා ෂියාමන් නගරයේ චීන භාෂා පුහුණුවක් ලැබීමට ද මට හැකි විය. මෙම කඳවුර සඳහා ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 9 ක කොන්ෆියුසියස් මධ්‍යස්ථාන නියෝජනය කරමින් සිසුහු සහභාගි වූහ. විශේෂයෙන් චීනයේ ඉතා වැදගත් නැරඹිය යුතු ස්ථාන වන චීන මහා ප්‍රාකාරයත්, ගිම්හාන මාළිගය මෙන්ම ෂියාමන් නගරයේ ගුලන්ග්යු දිවයින ද මීට අමතරව හන්බන් කොන්ෆියුසියස් ආයතනයේ මූලස්ථානය හා චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය නැරඹීමට අවස්ථාව උදාවීම ද මා හට ඉමහත් සතුට දනවන කරුණක් වූ අතර එහිදී සිංහල සේවයේ චීන ජාතික හා ශ්‍රී ලාංකික කාර්ය මණ්ඩලය මුණ ගැසීමට අවස්ථාව ලැබිණ. එමෙන්ම චීන හා සිංහල භාෂාවෙන් සම්මුඛ සාකච්ඡාවකට පෙනී සිටීමට හැකි වීම නැවුම් අත්දැකීමක් විය.

ලුම්බිණි කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ ආරම්භයේ සිට මේ දක්වා චීන භාෂාව ඉගෙනීම සඳහා මධ්‍යස්ථානය මගින් මා හට මනා සහයෝගයක් ලැබිණ. චීන ජාතික ගුරුවරුන් මෙන්ම ශ්‍රී ලාංකික ගුරුවරුන්ගෙන් ද චීන භාෂාව ඉගෙනීමට අවස්ථාව ලැබුණු අතර මධ්‍යස්ථානය සතු පුස්තකාල හා පරිගණක පහසුකම් භාවිතයෙන් භාෂාව නිවැරදි ලෙස පුහුණුවීමටද හැකිවිය. මධ්‍යස්ථානය ආරම්භ කළ දින සිට නොකඩවා අධ්‍යාපනය ලැබීමට හැකිවීමත්, විවිධ ක්‍රියාකාරකම් මගින් ලබාගත් දැනුම හා අත්දැකීම් ද මාගේ ජීවිතයට ඉතා ප්‍රයෝජනවත් විය.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය හා එහි සිංහල සේවයේ කාර්ය මණ්ඩලය මෙන්ම ලුම්බිණි කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය ද ඉතා ගෞරවයෙන් ස්තුති පූර්වකව මෙහිදි සිහිපත් කරමි.

තරිඳු විජේරත්න

චීනයට ගිය දිනය හා එහි ගත කළ කාලය

2012.11.14 දින සිට 2012.11.26 දින දක්වා

යාමට හේතුව හා එහි ගිය ස්ථාන

"Chinese Bridge" තරග මාලාවෙන් ජයග්‍රහණය කර ලැබූ ශිෂ්‍යත්වයක් මත චීනයට ගියෙමි. එහිදී

- චීන මහා ප්‍රාකාරය
- CRI කොන්ෆියුසියස් මූලස්ථානය
- Yunnan විශ්වවිද්‍යාලය හා පුස්තකාලය
- Rock Forest
- Yunnan ගම්මානය
- Yunnan Minzu Middle School හා
- Yunnan කෞතුකාගාරය නැරඹීමට අවස්ථාව ලැබිණ.

චීනය පිළිබඳ පෞද්ගලික අදහස්

චීනය දිනෙන් දින දැවැන්ත සංවර්ධනයක් කරා පිය ඔසවන රටකි. චීන ජාතිකයින්ගේ ධනාත්මක චින්තනය, දැඩි අධිෂ්ඨානය හා වෙහෙස නොබලා වෙලාවට වැඩ කිරීම ඔවුන්ගේ දියුණුවේ රහස ලෙස මට හැඟේ. ලොව පැරණිතම ශිෂ්ටාචාරයකට උරුමකම් කීවද, චීන ජනතාව අද ආර්ථික වශයෙන් සමස්ථ ලෝකයේම බලවතෙකු වී තිබේ. එම දියුණුවට හේතු පාදක වනුයේ වසර ගණනාවක් තුළ මෙහෙයවනු ලැබූ නිවැරදි දේශපාලනික ආර්ථිකමය හා සමාජීය දැක්ම මෙන්ම චීන ජනතාව එකම හදවතකින් හා දැඩි අධිෂ්ඨානයකින් තම වගකීම් හමුවේ ක්‍රියා කිරීම යැයි මට සිතේ. මේ සියල්ලම හමුවේ ජන ජීවිත ඉහළ මට්ටමක නංවා තිබීමද පැසසිය යුතුය.

මේ සියල්ලන් අතරේ චීන ජනතාව තම පිරිසිදුකම හා පිළිවෙල අකුරටම පිලිපැදීම විශේෂත්වයකි. එමෙන්ම ලෝක සාමය හා සංවර්ධනයටත් සෙසු රටවල් සමග අන්‍යෝන්‍ය සබඳතා පවත්වා ගැනීමටත් ඔවුන් ප්‍රමුඛස්ථානයක් දී තිබේ.

ලුම්බිණි CRI කොන්ෆයුසියස් මධ්‍යස්ථානය

ශ්‍රී ලාංකීය දරුවන්ට චීන භාෂාව හැදෑරීමට ඇති ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස ලුම්බිණි CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය හැඳින්විය හැක. එහි නවීන භාෂාගාර පහසුකම් වලින් සමන්විත පංති කාමරයක් සහ පුස්තකාල පහසුකම්ද තිබේ. චීන ජාතික ගුරුභවතුන්ගේ සුහදශීලීත්වය විශේෂයෙන් අගය කළ යුතුය. එමෙන්ම විධායක උප සභාපති ජේ.ජී. අමරජීව මහතා ඇතුළු සෙසු කාර්ය මණ්ඩලයේ කැපවීම හා උනන්දුව මත අපගේ ඉගෙනුම් ක්‍රියාවලියට මහත් රුකුලකි.

මෙම මධ්‍යස්ථානයේ චීන භාෂාව හදාරන දරුවන්ට නොමිලේ චීන සංචාරයන්ට අවස්ථා ලබා දීමද දරුවන්ට මහත් භාග්‍යන් වේ. ලොව වැඩිම පිරිසක් භාවිතා කරන චීන බස ලංකාවේ දරු දැරියන් අතර ප්‍රචලිත කිරීමට හැකි වීම මෙම මධ්‍යස්ථානය ලැබූ සුවිශේෂ ජයග්‍රහණයකි.

අනාගත ලෝකයේ දියුණුවේ නව මංමාවත් සොයා යාමට දොරගුළු විවර කරගන්න ඔබත් එන්න අප හා චීන බස ඉගෙන ගන්න.

යසිසි චර්මදා කුෂ්ලානි

ලුම්බිණි විද්‍යාලයේ CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය ආරම්භක පන්තියේ ශිෂ්‍යයන් ලෙස මා අවුරුද්දක් චීන භාෂාව හදාරමින් සිටියදී ශිෂ්‍යත්වය ලැබී චීනයේ Yichang පලාතේ San Xia (3 Georges) විශ්ව විද්‍යාලයට යාමට මට අවස්ථාව හිමි වුනා. ඒ අනුව 2010 වරරේදී සැප්තැම්බර් මාසයේ මා 6 මාසික ශිෂ්‍යත්වයක් සඳහා චීන දේශය බලා පිටත් වූයෙමි.

CRI කොන්ෆියුසියස් මධ්‍යසථානයෙන් ලද එම පූර්ණ ශිෂ්‍යත්වයෙන් අප එම විශ්ව විද්‍යාලයේ චින භාෂාව ආරම්භක මට්ටම හැදෑරූ අතර, HSK 3 වන මට්ටමේ පරීක්ෂණයට සහභාගී වී ඉන් ඉහලින් සමත් වීමටද අවස්ථාව සැලසුනි. චීන ජාතික ගුරුවරු සියලු දෙනාම දැඩි කැපවීමකින් අපට ඉගැන්වූ අතර හැකි සෑම විටම අපට එදිනෙදා ජීවිතයේ කටයුතු සඳහාද උදව් උපකාර කළහ.

චීන භාෂාව හැදෑරීමේ අවස්ථාවට අමතරව එහි සිටි කාලය තුලදී අපට විවිධ සුන්දර ස්ථාන නැරඹීමටද විවිධ පුද්ගලයන් හඳුනාගැනීමටද අවස්ථාව සැලසුනි.

විශ්ව විද්‍යාලය විසින් සති අන්තයේදී සංවිධානය කරනු ලැබූ චාරිකා වලදී

3 Gorges වේල්ල සහ දිය ඇල්ල.
Chang Yang Qing Jiang වැව

ආදී ස්ථාන රැසක් නැරඹීමට යාමට අපට අවස්ථාව උදාවිය. මේ සෑම ගමනක්ම විශ්ව විද්‍යාලය මගින් අනෙකුත් විදේශ සිසු සිසුවියන් සමගින් යාමට ඉඩ සැලැස්වූ අතර එමගින් සියලු දෙනා අතර සමගිය හා අවබෝධය ඇති කර ගැනීමට හැකිවිය.

අප සමග ඉන්දුනිසියාව, කාම්බෝජය, ඉන්දියාව, ඕස්ට්‍රියාව, නයිජීරියාව ආදී රටවල් රැසක් සිසු සිසුවියන් ඉගෙනුම ලැබූ අතර ඒ සියලු දෙනා සමග ඇතිවූ මිතුරුදම අප අදටත් පවත්වාගෙන යන්නෙමු.

මෙවන් මහඟු අවස්ථාවක් ලබා දී ලෝකය දකින්නට මග විවර කර දුන් CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය ආයතනයට මගේ හදපිරි ස්තූතිය පිරිනමන්නෙමි.

අනුරාධා වේරපිටිය

CMEC 中国机械设备工程股份有限公司 China Machinery Engineering Corporation

中国机械设备工程股份有限公司祝贺国际台斯里兰卡兰比尼孔子课堂成立5周年，祝孔子课堂培养出越来越多的本地汉语人才，更广泛地传播中华文化，为中斯两国的友谊做出更多的贡献。

中国机械设备工程股份有限公司（CMEC）成立于1978年，是中国第一家工贸结合，以国际工程总承包、成套设备出口及机电产品进出口业务、研发设计及相关国际服务业务为经营主体的国际知名的大型国际化综合性企业集团。作为国际知名的工程承包商，CMEC在中国商务部公布的中国对外承包工程完成营业额连续多年名列前10位，并连续多年跻身ENR全球最大225家国际工程承包商排名。“CMEC”已经成为国际工程界的知名品牌。

国际工程总承包和成套设备出口作为CMEC的核心业务，已遍及世界五大洲，截至目前CMEC已与世界上150多个国家和地区建立了广泛的业务往来和商务资讯网络。在国际贸易产业链条中，CMEC在国际工程设计、国际贸易、国际展览、国际物流、国际招标等多个方面都具有较强的竞争力。据益普索行业报告，对比2012年全球国际电力能源项目收入，CMEC在中国承包商中名列第4位。

由CMEC建设的斯里兰卡普特拉姆电站是该国第一座燃煤电站，同时也是斯建国以来最大工程建设项目，更是迄今为止中斯两国最大的经贸合作项目，其图像被印在了该国一百卢比面值的纸币上。普特拉姆电站堪称斯里兰卡能源输出的大动脉，目前它的总发电量占到该国整个电网需求的45%。同时，它又是中、斯两国之间不断加深友谊的桥梁，为斯里兰卡人民生活水平的提高和推动斯国内经济建设的发展，做出了历史性的贡献。

CMEC以“让创想成真”为企业理念，“以提高人民生活品质”为社会责任，不断致力于互利互惠、共同发展、和谐进步。秉承“以人为本，创新、竞争、合作，诚信、敬业、和谐”的企业文化，努力成为在国际工程承包、国际贸易及相关服务业中全球领先国际工程承包与服务商。

CMEC作为一家国际化的公司，深深认识到所肩负的社会责任，始终致力于促进经济发展和社会进步。我们承建的电站给人们送去了光明，承建的交通基础设施给人们提供了出行的便利，承建的通讯设施给人们带来了联系的快捷，承建的广播电视台使人们提升了生活品质。同时，捐资助学帮助渴望知识的学子实现人生梦想，为灾区募捐给受灾群众带来了重建家园的希望。

展望未来，CMEC将继续务实创新，提供超值服务，建设更多的高质量国际工程。我们衷心地希望与新老朋友加强经贸合作交流，致力于推动世界经济发展和人民幸福。

CRI ලුම්බිණි විද්‍යාලයීය කොන්ෆියුසියස් මධ්‍යස්ථානය ආරම්භ වී මෙම වසරට වසර 5ක් සපිරෙයි. ශ්‍රී ලාංකික ජනතාව අතර චීන භාෂාව හා චීන සංස්කෘතිය ප්‍රචලිත කිරීම සඳහා පෙරට වඩා වැඩි මෙහෙවරක් ඉදිරියේදී CRI ලුම්බිණි විද්‍යාලයීය කොන්ෆියුසියස් මධ්‍යස්ථානය ඉටු කරනු ඇතැයි ද එමගින් චීන ශ්‍රී ලංකා මිත්‍රත්වය තවදුරටත් වර්ධනය වනු ඇතැයි ද අපි ප්‍රාර්ථනා කරමු.

CMEC සමාගම වසර 1978 දී පිහිටුවන ලද අන්තර්ජාතික සමාගමකි. විදේශවල ව්‍යාපෘති ඉදි කිරීම, විද්‍යුත් යන්ත්‍ර ඇතුළු යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ආනයනය, අපනයනය, සංවර්ධනය, සැලසුම් නිර්මාණය සහ ඊට අදාළ සේවා කටයුතු පදනම් කර ගෙන සමාගම කටයුතු කරයි. නිමැවුම් හා වෙළඳ ගනුදෙනු එකට සම්බන්ධ කළ ප්‍රථම චීන සමාගම ද අපේ සමාගමයි.

මේ වන විට, අප සමාගම ව්‍යාපෘති ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ලෝකයේ ප්‍රකට සමාග මක් බවට පත් වී තිබේ. චීන වාණිජ අමාත්‍යාංශය නිකුත් කළ සංඛ්‍යාලේඛන අනුව, විදේශවල ඉදි කිරීම් කටයුතු භාර චීන සමාගම් අතරින්, CMEC සමාගම වසර ගණනාවක් තිස්සේ පළමු ස්ථාන 10 අතරට ඇතුළත් ව සිටී. එසේ ම, වසර ගණනාවක් තිස්සේ අප සමාගම ගෝලීය විශාලතම ඉදිකිරීමේ සමාගම් 225 අතර පසු වීම ද විශේෂත්වයකි.

මේ වන විට, අපි රටවල් 150කට වැඩි ප්‍රමාණයක් සමඟ සමීප සබඳතාවක් ඇති කර ගෙන තිබේ. ජාත්‍යන්තර වශයෙන්, ව්‍යාපෘති සැලසුම් කිරීම, වෙළඳ ගනුදෙනු, ප්‍රදර්ශනය, සැපයුම් සංවිධානය, ටෙන්ඩර් කැඳවා ගැනීම වැනි ක්ෂේත්‍රවල අප ප්‍රබල තරගකාරී සමාගමක් බවට පත් ව තිබේ. වසර 2012 සංඛ්‍යාලේඛනයකට අනුව, විදුලි බල උත්පාදනයෙන් ලත් ආදායම් අනුව, චීන සමාගම් අතර අප සමාගම 4වන ස්ථානය අත්පත් කර ගත්තේ ය.

අප ඉදි කිරීම් භාර ව කටයුතු කළ නොරච්චෝලෙ විදුලි බලාගාරය ශ්‍රී ලංකාවේ පළමු ගල්අඟුරු බලාගාරයයි. එමෙන් ම, මෙරට නිදහස ලැබීමෙන් අනතුරුව ඉදි කළ විශාලතම ව්‍යාපෘතිය ද නොරච්චෝලෙ විදුලි බලාගාරයයි. තව ද, එය ද චීනය සහ ශ්‍රී ලංකාව අතර ඇති විශාලතම ආර්ථික සහයෝගිතා වැඩසටහන ලෙස ද සැලකිය හැකි ය. එසේම,

ශ්‍රී ලංකාවේ සියයේ මුදල් නෝට්ටුවෙහි එම විදුලි බලාගාරයේ අනුරූපය ද දක්නට ලැබේ. එහි විදුලි උත්පාදනය ශ්‍රී ලංකාවේ සමස්ත විදුලි උත්පාදනයෙන් සියයට 45ක පංගුවක් ගනී. මෙරට විදුලි බල සැපයුම් සඳහා මෙම බලාගාරය වැදගත් මෙහෙවරක් ඉටු කරයි. ඉදිරියේදී, චීන ශ්‍රී ලංකා මිතුදමේ සංකේතයක් වන නොරච්චෝලෙ විදුලි බලාගාරය ශ්‍රී ලංකා ජනතාව හා මෙරට ජාතික සංවර්ධනය සඳහා වඩා වැඩි දායකත්වයක් ලබා දෙනු ඇතැයි අපි විශ්වාස කරමු.

නිර්මාණශීලිත්වය හා කාර්යක්ෂමතාව කෙරෙහි අපි දැඩි අවධානය දක්වයි. මේ අතර, ජන ජීවිතය යහපත් කිරීම ඇතුළු සමාජයේ වගකීම් ද භාර ගත යුතු බව අපි හඳුනා ගෙන තිබේ. අපි ඉදි කළ විදුලි බලාගාරය ශ්‍රී ලංකාව සඳහා වැඩි ආලෝකයක් ලබා දී ඇත. එමෙන්ම, සමාගමේ මැදිහත් වීමෙන් දායාද කළ මහා මාර්ග සහ විදුලි සන්නිවේදන, ගුවන් විදුලි හා රූපවාහිනී උපකරණ ද ලාංකික ජනතාවට සෙත සලසා දුන්නේ ය. ඊට අමතරව, අධ්‍යාපනය බලාපොරොත්තු වන ළමුන්, තරුණයන් සහ විපතට පත් ජනතාව වෙනුවෙන් ද අපි අපේම දායකත්වය ලබා දී ඇත. ඉදිරියේදී, ශ්‍රී ලාංකික ජනතාව ඇතුළු ලෝකයේ විවිධ රටවල ජනතාව වෙනුවෙන් පෙරට වඩා වැඩි මෙහෙවරක් ඉටු කිරීමට අපි අපේක්ෂා කරමු.

ZTE中兴

ZTE SRI LANKA OFFICE
中兴通讯（斯里兰卡）办事处

值此国际台兰比尼孔子课堂成立5周年之际，中兴通讯斯里兰卡子公司对孔子课堂过去5年来取得的成绩表示祝贺，祝孔子课堂培养越来越多的本地优秀汉语人才，把课堂建设成为中斯文化交流的纽带。

中兴通讯于1999年进入兰卡市场，至今已经15个年头。 2004年设立本地办事处，2008年注册成立了中兴通讯兰卡子公司。 截止2014年，中兴通讯兰卡子公司有超过100个员工，其中80%为本地工作人员

中兴通讯和本地多家运营商有良好的合作关系，如Dialog，Mobitel，SLT，Etisalat，Hutch等。总的合同额超过4亿美金。为兰卡移动通讯以及固网宽带的发展，做出了较大的贡献。其中在SLT固网宽带市场份额超过了80%。在Mobitel建立了南亚第一个LTE网络。

中兴通讯还多次参与本地社会公共事业，2010年在时任副总理张德江访问之际，捐赠了50万美金的通信设备；2013年刘云山书记访问之际，捐赠了6万美金的远程教育系统。从1999年至今，每年招收多名本地大学毕业生，总共培养了1000多名本地的高级通信技术人才。

中兴通讯希望借助自身先进的通信和信息解决方案，能够将斯里兰卡的ICT运用水平提高到一个新的阶段。

CRI ලුම්බිණි විද්‍යාලයීය කොන්ෆියුසියස් මධ්‍යස්ථානය ආරම්භ වී මේ වන විට වසර 5ක් සපිරෙයි. ශ්‍රී ලංකාවේ ZTE සංනිවේදන ශාඛා සමාගම ඒ වෙනුවෙන් උණුසුම් සුභ පැතුම් පිරිනමයි. CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය මගින් දිනෙන් දින බිහිවන චීන භාෂා ප්‍රවීණයන් චීන ශ්‍රී ලංකා මිත්‍රත්ව වර්ධනයට විශාල රුකුලක් වනු ඇතැයි යන්න අපේ විශ්වාසයයි.

ZTE සංනිවේදන සමාගම ශ්‍රී ලංකා වෙළෙඳ පොලට පිවිසුණේ වසර 1999 දී ය. ඒ මෙයට වසර 15කට පෙර ය. වසර 2004 වන විට, ZTE සමාගමට ශ්‍රී ලංකාවේ ඒජන්සි ආයතනයක් ස්ථාපිත කිරීමට හැකි විය. ශ්‍රී ලංකාවේ ZTE සංනිවේදන ශාඛා සමාගම නිළ වශයෙන් ආරම්භ කෙරුණේ වසර 2008 දී ය. මේ වන විට ZTE සමාගමේ සියයකට අධික සේවක මණ්ඩලයෙන් සියයට අසූවක්ම ශ්‍රී ලාංකිකයන් ය.

ZTE සංනිවේදන සමාගමට ලංකාවේ බොහෝ සංනිවේදන සමාගම් සමග සුහද සහයෝගතා සබඳතාවක් ගොඩ නගා ගැනීමට හැකි වී තිබේ. Dialog, Mobitel, SLT, Etisalat සහ Hutch යන සමාගම් ඒ අතර ය. එම සමාගම් සමග ඇමෙරිකානු ඩොලර් මිලියන 400ක වටිනාකම ඇති කොන්ත්‍රාත්තු අත්සන් කර ඇති ZTE සමාගමට, ශ්‍රී ලංකාවේ ජංගම සංනිවේදනය සහ ස්ථාවර මාර්ග බ්‍රෝඩ්බෑන්ඩ් සංවර්ධනය වෙනුවෙන් විශාල දායකත්වයක් ලබා දීමට හැකි වීම ආඩම්බරයකි. ශ්‍රී ලංකාවේ SLT ස්ථාවර මාර්ග බ්‍රෝඩ්බෑන්ඩ් ව්‍යාපාරයේ සියයට 80ක වෙළෙඳ කෝටාව හිමි කර ගැනීමට ZTE සමාගමට සමත් වී තිබේ. මෙම සමාගමට ප්‍රථම දකුණු ආසියානු LTE ජාලය ශ්‍රී ලංකාවේදී සම්පූර්ණ කිරීමට හැකි ව ඇත්තේ Mobitel සමාගමේ සහයෝගයෙනි.

ZTE සමාගම ශ්‍රී ලංකාවේ පොදු සමාජයීය ව්‍යාපෘතිවලට ද උනන්දුවෙන් එක් වෙයි. වසර 2010 දී එවක චීන උප අග්‍රාමාත්‍ය චාං ඩචියාං මහතා ශ්‍රී ලංකාවේ නිළ සංචාරයක යෙදුණි. එම සංචාරය නිමිති කර ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 5ක වටිනාකමින් යුත් සංනිවේදන උපකරණ ශ්‍රී ලංකාවට පරිත්‍යාග කිරීමට ZTE සමාගම ක්‍රියා කළේ ය. එමෙන්ම වසර 2013 දී චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ ලේකම් කාර්යාලයේ ලේකම් ලියු යුන් ශැන් මහතාගේ ශ්‍රී ලංකා සංචාරය මුල් කර ඇමෙරිකානු ඩොලර් හැට දහසක මූල්‍යාධාරයක් ශ්‍රී ලංකාවේ දුරස්ථ අධ්‍යාපන පද්ධතියක් වෙනුවෙන් පිරිනැමීමට ද සමාගම දායක විය.

මීට අමතරව, ගත වූ වසර 15 තුළ ZTE සමාගම වාර්ෂිකව ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල උපාධිධාරීන් රැකියා සඳහා බඳවා ගෙන තිබේ. ශ්‍රී ලංකාවට සංනිවේදන ප්‍රවීණයන් දහසක් පමණ බිහි කිරීමට මේ වන විට ZTE සමාගමට හැකි වී තිබේ.

සමාගම සතු දියුණු සංනිවේදන අත්දැකීම් භාවිතයෙන් ICT තාක්ෂණය ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම වර්ධනය ZTE සමාගමේ නවතම අභිලාෂයයි.

CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය පිහිටුවීමේ 5 වන සංවත්සරයට අපගේ සුබපැතුම් ...
中国商品 应有尽有
P促销 PROMOTION
P促销 PROMOTION
润茗中国超市
联系人：周老板
地址：18B, Alfred Place, Colombo 3
联系电话：0770 111 212 营业时间：9:00 - 21:00
微信号：RUN770111212 QQ：756244964

CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය පිහිටුවීමේ
5 වන සංවත්සරයට අපගේ සුබපැතුම්
සැබෑ චීන කෑම වේලක රසය විඳගන්න
Moon River 月亮河
Chinese Sea Food Restaurant
වසර දහයක් පැරණි ඉහළ පෙළේ අවන්හලකි
චීන අරක්කැමියන් විසින් පිසිනු ලබන රසවත් චීන ආහාර
පවුලේ සැමට එකට ආහාර ගත හැකි ඉඩ පහසුකම්
නෑදෑ මිතුරන් සමගින් ඔබේ ප්‍රිය සාදයට කදිම තැනකි
Moon River
Chinese Sea Food Restaurant
No 140, Thimbirigasyaya Road, Colombo 05.
Tele: 0112 596 885

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය

චීනය සහ ජාත්‍යන්තර ප්‍රජාව එකට එක් කරමින් චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය ආරම්භ කෙරුණේ 1941 දෙසැම්බර් මස 3 වැනි දාය. අද වන විට එය ලොව පුරා වැඩිම භාෂා ගණනාවක් විකාශනය කරන විශාලතම ගුවන් විදුලි ජාලයක් බවට පත්ව තිබේ. එයින් ලොව පුරා විකාශනය කෙරෙන භාෂා ගණන මේ වන විට 65කි. ලෝකයේ සංනිවේදන විධික්‍රම වඩාත් පුළුල් වීමත් සමඟ අන්තර්ජාල රූප මාධ්‍ය හා ජංගම දුරකථන සහ පොඩ්කාස්ටින් වැනි නූතන බහුවිධ මාධ්‍ය ඔස්සේ සිය විකාශන ජාලය ශක්තිමත් කිරීමට චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය පියවර ගත්තේය. ඒ අනුව වසර 2011 ජනවාරි 18 වනදා CIBN චීන අන්තර්ජාතික ගුවන්විදුලි විකාශන ජාලය ආරම්භ කෙරිණ. වසර 2013 වන විට විදේශ නාගරික ගුවන් විදුලි සේවා 91ක් සහ FM හා අන්තර්ජාල ගුවන් විදුලි සේවා 22ක් චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සතු වෙයි. රටවල් 32ක ප්‍රවෘත්ති වාර්තාකරණ ඒජන්සි ආයතන පිහිටුවා තිබේ. ලොව පුරා විසිරුණු කොන්ෆියුසියස් මධ්‍යස්ථාන සංඛ්‍යාව 13කි. චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ අසන්නන්ගේ සමාජ 4114ක් ලොව පුරා ක්‍රියාත්මකය.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය

ශ්‍රී ලංකා ජන ජීවිතය මැනවින් හඳුනාගත් සුහද මිතුරෙකු ලෙස චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ඉදිරි ගමනක් ආරම්භ කර තිබේ. ශ්‍රී ලංකාව පුරා විසුරුවා හැරෙන කෙටි තරංග සහ බස්නාහිර පළාත ආවරණය කරන FM තරංග විකාශනයක් සිංහල සේවය සතුවෙයි. සියළු වැඩසටහන්වලට පොඩ්කාස්ටින් සේවාව ඔස්සේද සවන් දිය හැකිය.

සිංහල සේවය ආරම්භ වූයේ වසර 1975 ජනවාරි පළමු දාය. එවක පැවැතියේ කෙටි තරංග විකාශනයක් පමණි. වසර 2010 අප්‍රේල් 23 වනදා එහි FM තරංග විකාශනය ආරම්භ කෙරිණ.

මේ වන විට චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍ය හා පුවත්පත් සමඟ මනා සහයෝගික සම්බන්ධතාවකින් යුක්තව ඉදිරියට ගමන් කරමින් සිටී.

	Frequency	Time (Sri Lanka)	
FM	CRI - Sri Lanka FM97.9	11:30-13:30	17:30-19:30
Short wave	49.8/31.6/30.61/25.21	19:30-20:30	05:00-06:00
Online	http://sinhalese.cri.cn/		

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවයේ වැඩසටහන් ශ්‍රී ලංකාවේ සමස්ත පවුල් ඒකකය ඉලක්ක කොට විසුරුවා හරිනු ලැබේ. වැඩසටහන් අන්තර්ගතය චීනය සහ ශ්‍රී ලංකාව අතර ඇති සාම්ප්‍රදායික මිත්‍රත්වය සහ රාජ්‍යතාන්ත්‍රික බැදීම පදනම් කොට සකස් කර තිබේ. සතියේ දින පහ තුළ, ආර්ථිකය, සංස්කෘතිය, ජන ජීවිතය සහ මිත්‍රත්වය, සංචාරය, සූප කලාව, චීනයේ භාෂා අධ්‍යයනය වැනි විෂය ක්ෂේත්‍ර ඔස්සේ වැඩසටහන් විකාශනය කෙරේ. විචිත්‍රාංග සමාජ හා කාලීන තොරතුරු සඳහා ද විශේෂත්වයක් හිමිව තිබේ. චීනයේ ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ නැවුම් තොරතුරු රැගත් ප්‍රවෘත්ති විකාශනයක්ද දිනපතා සිදු කෙරේ.

සුභාසර පාඨක සාමාජිකයෝ

සාමාජික අංක: 21
සසිනි භාග්‍යා
යසෝදරා විද්‍යාලය
කොළඹ

සාමාජික අංක: 22
ෂිලෝනි ෆින්ෂියා
සියලු සාන්තුවරයන්ගේ
බාලිකා විද්‍යාලය
කොළඹ

සාමාජික අංක: 23
හරිනි උපේන්ද්‍රිකා
අනුලා විද්‍යාලය
කොළඹ

සාමාජික අංක: 24
කේෂානි හංසනී
සියලු සාන්තුවරයන්ගේ
බාලිකා විද්‍යාලය
කොළඹ

සාමාජික අංක: 25
ශාවින්ද්‍රා හංසනී
සියලු සාන්තුවරයන්ගේ
බාලිකා විද්‍යාලය
කොළඹ

සාමාජික අංක: 26
නිපුනි කෞෂල්‍යා
සියලු සාන්තුවරයන්ගේ
බාලිකා විද්‍යාලය
කොළඹ

සාමාජික අංක: 27
යුගනි වර්ෂි
සියලු සාන්තුවරයන්ගේ
බාලිකා විද්‍යාලය
කොළඹ

සාමාජික අංක: 28
හංසක තරින්දි
සියලු සාන්තුවරයන්ගේ
බාලිකා විද්‍යාලය
කොළඹ

සාමාජික අංක: 29
J. A. S නිරෝෂිණී
හේමමාලි බාලිකා
මහනුවර

සාමාජික අංක: 30
චන්ද්‍රානි පූර්ණිමා
කෑගලු බාලිකා
විද්‍යාලය
කෑගල්ල

සාමාජික අංක: 31
ෂමංගා චමත්නි
යසෝදරා විද්‍යාලය
කොළඹ

සාමාජික අංක: 32
අංජලී ෂෙහාරා
යසෝදරා විද්‍යාලය
කොළඹ

සාමාජික අංක: 33
අශාන්ජලී තරුෂිකා
යසෝදරා විද්‍යාලය
කොළඹ



සාමාජික අංක: 34
M. R. L දාස්වත්ත
කෑගලු විද්‍යාලය
කෑගල්ල

සාමාජික අංක: 35
ඉෂානි පවිත්‍රා
ශ්‍රී සංඝමිත්තා ජාතික පාසල
මාතලේ



සාමාජික අංක: 36
සඳුනිකා සෙව්වන්දි
මහමායා බාලිකා විද්‍යාලය
මහනුවර

සාමාජික අංක: 37
ශසශ්‍රු අභිෂේක්
ඩී. එස්. සේනානායක විදුහල
කොළඹ

සාමාජික අංක: 38
චන්දිර දිනායු
ඩී. එස්. සේනානායක විදුහල
කොළඹ

ඔබ චීන භාෂාව ඉගෙන ගන්න කැමතිද?

CRI
කොන්ෆියුසියස් මධ්‍යස්ථානය
වෙතින් ඒ සඳහා ඔබට කදිම අවස්ථාවක්

අප පාඨමාලාවේ සුවිශේෂතා

- චීන භාෂාව ලිවීම, කියවීම, කථා කිරීම හා සවන් දීම පිළිබඳ මනා නිපුණතාවයක්
- සෑම චීන භාෂා විභාගයක් වෙනුවෙන් ජාත්‍යන්තර වශයෙන් පිළි ගන්නා සහතික පත්‍රයක්.
- චීනයේ විශ්ව විද්‍යාලවල ඕනෑම පාඨමාලාවක් හැදෑරීමේ අවස්ථා
- චීනයේ දින තුනක, පහක, සතියක හෝ දෙසතියක අධ්‍යාපන චාරිකා

Lumbini College, Havelock Town, Colombo 05.
P. O. Box: 1774. Tel/Fax : 00 94 11 258974 Email: sinhalaservice@gmail.com

中 国 国 际 广 播 电 台

CHINA RADIO INTERNATIONAL

SINHALA SERVICE
CHINA RADIO INTERNATIONAL

No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040
Tel: 00 86 10 6889 2330/2374
Fax: 00 86 10 68892361
Email: sinhalaservice@gmail.com
Web: http://sinhalese.cri.cn/
Facebook: Cheena Sinhala handa
Twitter: Voice of China-Lanka
Wechat: srilankacri